# 2013 අංක …… දරණ බීජ හා රෝපණ ද්‍රව්‍ය පනත

**බීජ හා රෝපණ ද්‍රව්‍ය වල ගුණාත්මක භාවය ආරක්ෂා කිරීම හා නියාමනය කිරීම, බීජ හා රෝපණ ද්‍රව්‍ය භාවිත කරන්නන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා හසුරුවන්නන්ගේ ක්‍රියාකාරකම් විධිමත් කිරීම හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, බීජ හා රෝපණ ද්‍රව්‍ය කර්මාන්තයේ සංවර්ධනය, කෘෂිකර්මාන්තයට වැදගත් වන්නා වූ දේශීය බීජ හා රෝපණ ද්‍රව්‍ය වල ජාන සම්පත් සුරක්ෂිත කිරීම හා සංරක්ෂණය සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධි විධාන සැලැස්වීමට හා 2003 අංක 22 දරන බීජ පනත පරිච්ඡින්න කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**1.** මෙම පනත …… අංක ……දරන බීජ හා රෝපණ ද්‍රව්‍ය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය**

## 1 වන කොටස

## පනත අදාලවීම

**2.** මෙම පනත බලාත්මක වන දින සිට පනතේ විධිවිධාන වලට අනුකූලව හැර, බීජ හා රෝපණ ද්‍රව්‍ය ආනයනය, අපනයනය, විකිණීම, විකිණීම සඳහා තබා ගැනීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ වෙනයම් ආකාරයකින් බෙදා හැර කිරීම හෝ වාණිජමය අරමුණකින් අන් පාර්ශවයකට සැපයීම හෝ හුවමාරුව ඇතුළුව පනතේ අරමුණු හා ගැටෙන කිසිදු කාර්යයක් කිසිදු තැනැත්තෙකු විසින් නොකළ යුත්තේ ය.

## 11 වන කොටස

## පනත පරිපාලනය

**3.** (මින් මතු මේ පනතේ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා මේ පනත යටතේ ඔහු වෙත නියම කරනු ලබන හෝ පවරන ලද කර්තව්‍ය ඉටු කිරීම සඳහා මේ පනතේ සාමාන්‍ය පරිපාලනය හා පනත ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිසි බලධාරියා වන්නේ ය. එමෙන් ම අධ්‍යක්ෂ ජනරාල්වරයා කෘෂිකර්මයට වැදගත් වන්නාවූ දේශීය පාරම්පරික හා පාරම්පරික නොවන බීජ හා ශාක ජාන සම්පත් ආරක්ෂණය හා සංරක්ෂණය පිළිබඳ වගකීම දරන නිසි බලධරයා ද වන්නේ ය.

**කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා පරිපාලනය භාරව කටයුතු කල යුතුය.**

**4.** (1) මේ පනත මගින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරන ලද කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය වන තාක් දුරට අධ්‍යක්ෂ ජනරාල්වරයාට තම බලය (මින් මතු මේ පනතේ " විෂය භාර අධ්‍යක්ෂ වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීම විෂය භාර අධ්‍යක්ෂවරයා සහ (මින් මතු මේ පනතේ "රෙජිස්ට්‍රාර්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) බීජ හා රෝපණ ද්‍රව්‍ය රෙජිස්ට්‍රාර්වරයා වෙත අභිනියෝජනය කළ හැකි ය.

**විෂය භාර අධ්‍යක්ෂවරයා**

(2) (අ) මේ පනතේ කාර්යය සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය රෙජිස්ට්‍රාර්වරයෙකු පත් කරනු ලැබිය යුතු ය,

**රෙජිස්ට්‍රාර්වරයා**

(ආ) රෙජිස්ට්‍රාර්වරයා බීජ තාක්ෂණයට අදාළ විද්‍යාත්මක විෂයයන් පිළිබඳ පශ්චාත් උපාධියක් සහිත ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ නිලධාරියෙකු විය යුතු අතර ඔහු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ විෂය භාර අධ්‍යක්ෂවරයාට වග කිව යුතු වන්නේ ය.

(3) (අ) රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යභාරයට සහායවීම සඳහා සේවා අවශ්‍යතාවයන් අනුව සහකාර රෙජිස්ට්‍රාර්වරුන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කළ හැක්කේ ය. **සහකාර රෙජිස්ට්‍රාර්වරුන් නම් කිරීම**

(ආ) සෑම බීජ හා රෝපණ ද්‍රව්‍ය සහකාර රෙජිස්ට්‍රාර්වරයෙකු විසින් රෙජිස්ට්‍රාර්වරයාගේ බලතල සියල්ලම හෝ ඉන් යම් බලයක් හෝ ක්‍රියාත්මක කළ හැකි අතර එම බලතල ක්‍රියාත්මක කිරීමේ දි ඔහු රෙජිස්ට්‍රාර්වරයාගේ පාලනයට සහ විධානයට යටත් විය යුතු වන්නේ ය.

(4) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා තමාට සහායවීම පිණිස අවශ්‍ය විය හැකි බලයලත් නිලධරයන් යනුවෙන් හැඳින්විය යුතු නිලධරයන් සංඛ්‍යාවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලැබිය යුතු ය. **බලයලත් නිලධරයන්**

(5) රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යය හා බලතල පහත පරිදි විය යුතු ය. **රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යය හා බලතල**

(අ) මෙම පනතේ කාර්යයන් සාර්ථක කරගැනීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවරනු ලබන රාජකාරි කටයුතු ක්‍රියාත්මක කිරීම හා පනත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පූර්ණ සහාය ලබාදීම.

(ආ) මෙම පනතට අදාළ සියලු ම ලියාපදිංචි කිරීමේ රාජකාරි

(ඇ) මෙම පනතේ කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන්නා වු අන්තර් ආයතනික සම්බන්ධීකරණය

(ඈ) සහකාර රෙජිස්ට්‍රාර්වරුන්ට රාජකාරි කටයුතු පැවරීම, අධීක්ෂණය, සම්බන්ධීකරණය හා නියාමනය

(ඉ) පනතේ කටයුතු වලට අදාළ දත්ත සංචිතයක් පවත්වාගෙන යාම

(ඊ) බීජ හා රෝපණ ද්‍රව්‍ය හා ශාක ජාන සම්පත් සම්බන්ධයෙන් අදාළ වන අනෙකුත් අණ පනත් වල කාර්යයන් සඳහා සහාය වීම

(උ) (මින් මතු මේ පනතේ "තාක්ෂණ හා උපදේශක කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) බීජ හා රෝපණ ද්‍රව්‍ය තාක්ෂණ හා උපදේශක කමිටුව විසින් කරනු ලබන ප්‍රමිතීන්, සම්මතයන් සහ මාර්ගෝපදේශයන් ප්‍රකාශයට පත් කිරීම සහ ක්‍රියාවේ යෙදවීම

(ඌ) බලයලත් නිලධාරීන්ගේ අදාළ රාජකාරි කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය

(එ) බීජ හා රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නන්ගේ පරිශ්‍ර පරීක්ෂා කිරීම, අදාළ තොරතුරු වාර්තා ලේඛන පරීක්ෂා කිරීම හා අවශ්‍ය අවස්ථාවල දී බීජ හා රෝපණ ද්‍රව්‍ය වල නියදි ගැනීම සහ ඊට අදාළ කටයුතු

(ඒ) කෘෂිකර්මාන්තයට වැදගත් වන්නාවූ දේශීය පාරම්පරික බීජ හා ශාක ජාන සම්පත් ආරක්ෂණය සහ සංරක්ෂණය සඳහා (මින් මතු මේ පනතේ පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය යනුවෙන් සඳහන් කරනු ලබන) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරනු ලබන කාර්යයන් සඳහා අවශ්‍ය අවස්ථාවල දී සහාය දැක්වීම

(ඔ)	බීජ හා රෝපණ ද්‍රව්‍ය වල අනන්‍යතාවය තහවුරු කර ගැනීමට අදාළ කටයුතු

(ඕ)	බීජ හා රෝපණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් වන සියලු ම පැමිණිලි විමර්ශනය කර අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සඳහා විෂය භාර අධ්‍යක්ෂවරයා වෙත යොමු කිරීම

(ක)	පනත ක්‍රියාත්මක කිරීමට අදාළව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවරනු ලබන වෙනත් රාජකාරි

(6)	අධ්‍යක්ෂ ජනරාල්වරයා, විෂය භාර අධ්‍යක්ෂවරයා, රෙජිස්ට්‍රාර්වරයා, සහකාර රෙජිස්ට්‍රාර්වරයන් සහ බලයලත් නිලධරයන් මෙම පනත යටතේ පවරනු ලබන කාර්යයන් ඉටු කිරීමේ අරමුණ සඳහා අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය යටතේ පොලිස් නිලධාරියෙකු වෙත පැවරී ඇති බලතල ක්‍රියාවේ යොදවනු ලබන තැනැත්තන් ලෙස සැලකිය යුත්තේ ය.

## 111 වන කොටස

## බීජ හා රෝපණ ද්‍රව්‍ය තාක්ෂණ හා උපදේශක කමිටුව

**තාක්ෂණ හා උපදේශක කමිටුව පත් කිරීම**

**5.**	(1.)	මෙම පනතේ කාර්යයන් සඳහා (මින් මතු මේ පනතේ "තාක්ෂණ හා උපදේශක කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) බීජ හා රෝපණ ද්‍රව්‍ය තාක්ෂණ හා උපදේශක කමිටුවක් පිහිටවනු ලැබිය යුතු ය. එම කමිටුව පහත දැක්වෙන පරිදි විය යුතු ය.

(අ)	නිල බලයෙන් පත්වන සාමාජිකයන්

i.	කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා
ii.	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණය, බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධනය, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධනය, වී පර්යේෂණ හා සංවර්ධනය, ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධනය, හා පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධනය යන විෂය භාර අධ්‍යක්ෂවරුන්
iii.	රෙජිස්ට්‍රාර්වරයා
iv.	බීජ සහතික කිරීමේ සේවය භාර ප්‍රධානියා
v.	පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය භාර ප්‍රධානියා
vi.	ජාතික ශාක නිරෝධායන සේවය භාර ප්‍රධානියා
vii.	පැළෑටි සංරක්ෂණ සේවය භාර ප්‍රධානියා
viii.	තේ, රබර්, පොල්, උක් සහ අනෙකුත් වැවිලි බෝග වලට අදාළ පර්යේෂණ ආයතනවල ප්‍රධානීන් හෝ ඔවුන්ගේ එක් නියෝජිතයෙක් බැගින්
ix.	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්
x.	ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්
xi.	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන සංරක්ෂක ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්
xii.	ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හෝ ඔහුගේ නියෝජිතයෙක්

xiii. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්

(ආ) මෙම තාක්ෂණ හා උපදේශක කමිටුව ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයක හෝ රාජ්‍ය දෙපාර්තමේන්තුවක හෝ පර්යේෂණ ආයතනයක සේවයේ නියුතු බීජ හා රෝපණ ද්‍රව්‍ය පිළිබද විද්‍යාත්මක ශික්ෂණයන්හි පළපුරුද්දක් ලබා ඇති බීජ තාක්ෂණඥයෙකු, බීජ ව්‍යාධිවේදියෙකු, කෘමි විද්‍යාවේදියෙකු, ශාක ව්‍යාධිවේදියෙකු පාංශු විද්‍යාවේදියෙකු, කෘෂි ඉංජිනේරුවරයෙකු, ශෂ්‍ය විද්‍යාඥයෙකු, ජාන තාක්ෂණය පිළිබඳ විද්‍යාඥයෙකු, කෘෂි ආර්ථික විද්‍යාඥයෙකු සහ නීති විශාරදවරයෙකු අතුරින් පහකට නොවැඩි (මින් මතු මේ පනතේ "පත් කළ තාක්ෂණ හා උපදේශක කමිටු සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් සංඛ්‍යාවක් ද බීජ හා රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නන් හෝ භාවිත කරන්නන් නියෝජනය කිරීම පිණිස බීජ හා රෝපණ ද්‍රව්‍ය පිළිබද විද්‍යාත්මක ශික්ෂණයක් සහිත කෘෂි විද්‍යාඥයන් දෙදෙනෙක් ද කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(ඇ) රෙජිස්ට්‍රාර්වරයා මෙම තාක්ෂණ හා උපදේශක කමිටුවේ ලේකම් ලෙස කටයුතු කළ යුතු ය.

(ඈ) තාක්ෂණ හා උපදේශක කමිටුව ඕනෑම අවස්ථාවක කැඳවීමේ බලය අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වන අතර අවම වශයෙන් මාස 06 කට වරක් වත් රැස්විය යුතු ය.

(ඉ) අධ්‍යක්ෂ ජනරාල්වරයා පැමිණ සිටී නම් ඔහු විසින් කමිටුවේ සෑම රැස්වීමක ම මුලසුන දැරිය යුතු ය. ඔහු යම් රැස්වීමකට පැමිණ නොසිටී නම් පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරින් එක් සාමාජිකයෙකු එම රැස්වීමේ මුලසුන දැරීමට තෝරා පත් කර ගත යුතු ය.

(ඊ) තාක්ෂණ හා උපදේශක කමිටු රැස්වීම සඳහා අවස්ථාවෝචිත පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයාට යම් විශේෂිත අවස්ථාවක දී යම් කාරණයක් සම්බන්ධයෙන් අමතර විශේෂඥ මතයක් අවශ්‍ය වේ නම් ඒ සඳහා සුදුසුකම් ලත් විද්වතුන් කැඳවා උපදෙස් ලබා ගත හැක.

(උ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් හැර අන්‍ය සෑම සාමාජිකයෙකු ම මරණය, ඉල්ලා අස්වීම හෝ අමාත්‍යවරයා විසින් ඉවත් කරනු ලැබීම නිසා නිල කාලය ඉකුත් වීමට කලින් ධුරය හිස් කළහොත් මිස, ඒ ධුරයට පත් කරන ලද දිනයේ සිට අවුරුදු තුනක කාලයක් සිය ධුරය දැරිය යුතු ය. එසේ වුව ද මිය ගිය, ඉල්ලා අස්වූ නැතහොත් අන්‍යාකාරයෙන් ධුරය හිස් නොකරන්නේ නම් තමා යම් සාමාජිකයෙකුගේ අනුප්‍රාප්තිකයා වන්නේ ද ඒ සාමාජිකයාගේ ඉකුත් නොවී ඇති ධුර කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(ඌ) නිල බලයෙන් පත්වන සාමාජිකයින් හැර කවර වූ හෝ සාමාජිකයෙකු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් කිසිදු හේතුවක් නොදක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර එම ඉවත් කිරීම පිළිබඳ කිසිදු අධිකරණයක දී ප්‍රශ්න නොකරනු ලැබිය යුතු වන්නේ ය.

(එ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් හැර නිල කාලය ගෙවීයාම නිසා ධුරය හිස් කරන යම් සාමාජිකයෙක් නැවත පත්කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

(ඒ) රෝගාතුරවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ යම් කාලයක් තුළ ස්වකීය ධුරයේ කාර්ය කිරීමට යම් සාමාජිකයෙකුට තාවකාලික ව නොහැකි වන්නේ නම් ඒ කාලය තුළ ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා වෙනත් යම් පුද්ගලයෙකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(ඔ ) තාක්ෂණ හා උපදේශක කමිටුවේ සාමාජිකයින් සඳහා පාරිශ්‍රමික සහ ගෙවීම් කරනු ලබන ආකාරය අමාත්‍යවරයා විසින් මුදල් විෂය භාර අමාත්‍යවරයාගෙන් විමසීමෙන් පසු තීරණය කරනු ලැබිය හැකි ය.

**තාක්ෂණ හා උපදේශක කමිටුවේ කර්තව්‍යයන්**

(2) මෙම තාක්ෂණ හා උපදේශක කමිටුව පහත කාර්යයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයාට, විෂය භාර අධ්‍යක්ෂවරයාට සහ රෙජිස්ට්‍රාර්වරයාට උපදෙස් හා නිර්දේශ ලබාදීම කළ යුතු ය.

(අ) බීජ හා රෝපණ ද්‍රව්‍ය වලට අදාළ ව ලියාපදිංචි කිරීම, ආනයන, අපනයන, නිෂ්පාදනය, ඇසිරීම, ගබඩා කිරීම, විකිණීම, ප්‍රවාහනය, භාවිතය, ප්‍රභේද/වර්ග අනුමැතිය යන කරුණු හා ඊට ආනුෂංගික කොන්දේසි හා විධාන නියම කිරීම හා මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ඊට අදාළ වෙනත් කරුණු සම්බන්ධයෙන් උපදෙස්දීම

(ආ) බීජ ඇසුරුම් හා රෝපණ ද්‍රව්‍ය සඳහා ලේබල් කිරීමේ අවම අවශ්‍යතාවයන් සහ ලේබල් කිරීමේ හා බීජ හා රෝපණ ද්‍රව්‍ය ලේබල් වල අඩංගු කරනු ලැබිය යුතු විස්තර නියම කිරීමේ ක්‍රියා පටිපාටිය සහ උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා වු රීති සහ පරිචය පිලිබඳ ක්‍රියා පටිපාටිය නිශ්චය කිරීම

(ඇ) එක් එක් බීජ හා රෝපණ ද්‍රව්‍ය විශේෂයට, වර්ගයට හෝ ප්‍රභේදයට යෝග්‍ය ඇසුරුම් වල තත්ත්වය, අවම පරිමාණය හා ප්‍රමාණය තීරණය කිරීම

(ඈ) එක් එක් බීජ හා රෝපණ ද්‍රව්‍ය විශේෂයට, වර්ගයට හෝ ප්‍රභේදයට යෝග්‍ය සැකසීමේ උපකරණ වල තත්ත්වය හා පිරිවිතර, ගබඩා තත්ත්ව හා ප්‍රවාහනයේ දි තිබිය යුතු යෝග්‍ය තත්ත්ව නිශ්චය කිරීම

(ඉ) බීජ වල හා රෝපණ ද්‍රව්‍ය වල ගුණාත්මකභාවයේ ප්‍රමිති සඳහා වාර්තාවක් හෝ සහතිකයක් නිකුත් කළ යුතු ආකාරය නිශ්චය කිරීම

(ඊ) බීජ හා රෝපණ ද්‍රව්‍ය පරීක්ෂා කිරීම (ක්ෂේත්‍ර ගබඩා සැකසීම, ඇසුරුම්කරණය ) සාම්පල් ගැනිම, විශ්ලේෂණය, පරීක්ෂණය හෝ පිරික්සුම සඳහා වු ක්‍රියා පටිපාටිය නිශ්චය කිරීම

(උ) මෙම පනත යටතේ වු කාර්යයන් සඳහා අය කල යුතු ගාස්තු හා වලංගු කාලසීමාවන් තීරණය කිරීම.

(ඌ) සදෝෂ බීජ හා රෝපණ ද්‍රව්‍ය භාවිත කිරීමට සැලැස්වීම හේතුවෙන් භාවිත කරන්නන්ට සිදුවිය හැකි අලාභ තක්සේරු කිරීම, හානිපූරණය පිළිබඳ නිර්ණායක හා මාර්ගෝපදේශයන් පිළිබඳ ක්‍රියා පටිපාටිය නිශ්චය කිරීම

(එ) කෘෂි ක්ෂේත්‍රයට අදාළ බෝගවල ජාන විකරණයට සහ අනෙකුත් නවීන විද්‍යාත්මක ක්‍රමවේදයන්ට අදාළ සම්මතයන් සහ ප්‍රමිතීන් නිශ්චය කිරීම

(ඒ) මෙම පනතේ කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය වන වෙනත් තාක්ෂණික සහාය ලබා දීම

(ඔ) අලෙවිය සඳහා ඉදිරිපත් කරන බීජ හා රෝපණ ද්‍රව්‍ය වල තිබිය යුතු ප්‍රරෝහණය, ජීව්‍යතාවය, ප්‍රවේනික පාරිශුද්ධතාවය, භෞතික පාරිශුද්ධතාවය සහ බීජ හා රෝපණ ද්‍රව්‍ය වල පෙනුම සඳහා යෝග්‍ය අවම සීමාවන් ද සහ ප්‍රවේනික අපාරිශුද්ධතාවය, හානි වූ බීජ, බීජ වල තෙතමන ප්‍රමාණය සහ පලිබෝධ (වල් පැළෑටි බීජ ඇතුලු ව) සඳහා උපරිම සීමාවන් ද සහ රෝපණ ද්‍රව්‍ය වල මූලාරම්භක ද්‍රව්‍ය සම්බන්ධයෙන් හා රෝපණ ද්‍රව්‍ය සඳහා වූ අවම ප්‍රමිතීන් ද ඇති කිරීම.

(3) තාක්ෂණ හා උපදේශක කමිටුවේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා එම තාක්ෂණ හා උපදේශක කමිටුවට සහය වීම පිණිස තාක්ෂණ හා උපදේශක කමිටුව විසින් තාක්ෂණ හා උපදේශක අනු කමිටු පත්කල හැක්කේ ය.

(4) තාක්ෂණ හා උපදේශක කමිටුව විසින් පහත දැක්වෙන කරුණු සියල්ල ම හෝ ඉන් යම් කරුණක් හෝ සම්බන්ධයෙන් තාක්ෂණ කමිටු රැස්වීමක දී රීති සාදනු ලැබිය හැකි ය.

(අ) තාක්ෂණ හා උපදේශක කමිටුවේ රැස්වීම් කාර්ය පටිපාටිය
(ආ) තාක්ෂණ හා උපදේශක කමිටුවේ කටයුතු පවත්වාගෙන යාම
(ඇ) තාක්ෂණ හා උපදේශක කමිටුවේ කටයුතු කරගෙන යාම හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික සියලු කරුණු

## IV වන කොටස

## ජාතික බීජ හා රෝපණ ද්‍රව්‍ය උපදේශන සභාව

**6.** (1) මේ පනතේ කාර්යයන් සඳහා (මෙහි මින් මතු "උපදේශන සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික බීජ හා රෝපණ ද්‍රව්‍ය උපදේශන සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය. **උපදේශන සභාව**

(2) උපදේශන සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය. **උපදේශන සභාවේ සංයුතිය**

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන්, එනම් :

i . කෘෂිකර්ම විෂය භාර අමාත්‍යංශයේ අමාත්‍යතුමාගේ ලේකම්වරයා (මින් මතු මේ පනතේ "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන)
ii මුදල් අමාත්‍යංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්
iii. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්
iv. පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්
v. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා
vi. රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්
vii. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ විෂය භාර අධ්‍යක්ෂවරයා
viii කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන විෂය

භාර අධ්‍යක්ෂවරයා

ix. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා

x. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා

xi. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන සංරක්ෂක ජනරාල්වරයා

xii. ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා

xiii. ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්වත් වෘත්තිකයින්ගේ සංගමයේ සභාපතිවරයා

(ආ) මෙම උපදේශන සභාවට (මෙහි මින්මතු "පත්කල උපදේශන සභාවේ සාමාජිකයන්"යනුවෙන් හඳුන්වනු ලබන)

i බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමෙහි, ආනයනය කිරීමෙහි, අලෙවි කිරීමෙහි, ගබඩා කිරීමෙහි, ප්‍රවාහනය කිරීමෙහි හෝ විකිණීමෙහි ලා වාණිජ සම්බන්ධතාවයක් නොමැති වූද ශ්‍රී ලංකාවේ ජාතික විශ්ව විද්‍යාල පද්ධතියේ කෘෂිකර්ම පීඨයක සේවයේ නියුතු බීජ හා රෝපණ ද්‍රව්‍ය තාක්ෂණය පිළිබඳ විශේෂඥවරයන් තිදෙනෙක් ද

ii බීජ හා රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නන් හෝ භාවිත කරන්නන් නියෝජනය කරන පුද්ගලයන් දෙදෙනෙකු ද

කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) ලේකම්වරයා සභාවේ සභාපතිවරයා විය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙම උපදේශන සභාවේ ලේකම්වරයා ලෙස කටයුතු කරනු ලබන්නේ ය.

**පත්කළ සාමාජිකයන්ගේ ධුර කාලය**

**7**. (1) ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කලහොත් මිස, සෑම පත්කළ උපදේශන සභාවේ සාමාජිකයකු ම අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය. කිසිදු තැනැත්තෙක් වාර දෙකකට වඩා පත් නොකළ යුත්තේ ය.

(2) පත්කළ උපදේශන සභාවේ සාමාජිකයකු විසින් තත් කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක දී සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබූ විට බලාත්මක වන්නේ ය.

(3) යම් පත්කළ උපදේශන සභාවේ සාමාජිකයකු රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ස්වකීය ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට තාවකාලික ව අපොහොසත් වන අවස්ථාවක, ඒ සාමාජිකයා වෙනුවට වැඩ බැලීම සඳහා වෙනත් පුද්ගලයෙකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(4) යම් පත්කළ උපදේශන සභාවේ සාමාජිකයෙකු අමාත්‍යවරයා විසින් හේතු නොදක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. එවිට ඒ සාමාජිකයා සිය ධුරය හිස් කර ඇති තැනැත්තකු ලෙස සැළකිය යුතු ය. ඉවත්කිරීම පිළිබඳ ව කිසිදු අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

(5) යම් පත්කළ උපදේශන සභාවේ සාමාජිකයෙකු ඉල්ලා අස්වීමෙන්, ඉවත් කරනු ලැබීමෙන් හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කළහොත් ඔහු වෙනුවට වෙනත් තැනැත්තෙකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරනු ලැබූ තැනැත්තා, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය හැකි ය.

(6) උපදේශන සභාව ඕනෑම අවස්ථාවක කැඳවීමේ බලය ලේකම්වරයා සතු වන අතර අවම වශයෙන් මාස 06කට වරක් වත් රැස්විය යුතු ය.

**8.** මෙම උපදේශන සභාවේ සාමාජිකත්වයට පත්කිරීමට පෙර හෝ පසුව ඇතිවන සිහිවිකලත්වය, උන්මත්තකභාවය, වස්තු භංගත්වය, අධිකරණයේ දී අපරාධ වරදකට වරදකරුවකු වීම හෝ සදාචාර විරෝධි ක්‍රියාවක් සඳහා වරදකරුවකු වීම නිසා මෙම උපදේශන සභාවේ සාමාජිකත්වය දැරීමට නුසුදුස්සකු වන්නේ ය.

9. (1) මෙම සභාවේ සියලු තීරණ බහුතරයකින් සම්මත විය යුත්තේ ය. **උපදේශන සභාවේ තීරණ**

(2) පත්කළ උපදේශන සභාවේ සාමාජිකයෙකුගේ හෝ සියල්ලගේ මරණය හෝ ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හෝ පත් නොකිරීම යනාදී කාරණා මත එකී ධුරය / ධුර හිස්ව පවතින අවස්ථාවක දී මෙම උපදේශන සභාවේ ගන්නා තීරණ එකී හිස්ව පැවතීම යන කාරණය මත අවලංගු නොවන්නේ ය.

(3) උපදේශන සභාවේ සාමාජිකයින් සඳහා පාරිශ්‍රමික සහ ගෙවීම් කරනු ලබන ආකාරය අමාත්‍යවරයා විසින් මුදල් විෂය භාර අමාත්‍යවරයාගෙන් විමසීමෙන් පසු තීරණය කරනු ලැබිය හැකි ය.

(4) මේ පනතේ විධිවිධාන වලට හා පනත යටතේ සාදන ලද යම් නියෝගයකට යටත් ව උපදේශන සභාවේ රැස්වීම් සම්බන්ධ සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාමේ ක්‍රියාවලිය සම්බන්ධ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට උපදේශන සභාවට හැකි ය.

10. පහත සියලු ම කාරණා සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම හා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම මෙම උපදේශන සභාවේ කාර්යය හා වගකීම වේ. **උපදේශන සභාවේ බලතල හා කර්තව්‍ය**

(1) මහජනතාවගේ සුභ සිද්ධිය හා ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම පිණිස ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය හැසිරවීමට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම.

(2) පුද්ගලික අංශයේ බීජ කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා රාජ්‍ය අංශයේ නියෝජ්‍යායතන සමග සම්බන්ධීකරණයක් ඇති කිරීම සහ බීජ හා රෝපණ ද්‍රව්‍යවලට අදාළ ගැටලු පිළිබඳ ව සලකා බැලීම.

(3) සක්‍රියතාවෙන් යුතු බීජ හා රෝපණ ද්‍රව්‍ය කර්මාන්තයක් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සහ මානව සම්පත් ලබාදීම

(4) (අ) දේශීය පාරම්පරික හා වැඩි දියුණු කළ බීජ හා ශාක ජාන සම්පත් සංරක්ෂණය සඳහා පහසුකම් සැලසීම.

(ආ) ගොවින් විසින් වගාකරනු ලබන හා නිර්දේශිත බෝග /ප්‍රභේදවල ජානමය පාරිශුද්ධතාවය තහවුරු කරගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික පහසුකම් සැලසීම සහ

(ඇ) ජාන විකරණය කරන ලද බෝග/ප්‍රභේද හඳුනා ගැනීම සඳහා පහසුකම් සැලසීම.

## V වන කොටස

## ලියාපදිංචි කිරීමේ කාර්ය පටිපාටිය

11. (1) සියලු ම බීජ හා රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නන් මෙම පනත යටතේ ලියාපදිංචි වී සහතිකයක් ලබා ගත යුතු ය. **ලියාපදිංචි කිරීම**

(2) (අ) ලියාපදිංචිය සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තු සමග කරනු ලබන සෑම ඉල්ලීමක් ම නියමිත ආකෘති පත්‍රය අනුව විය යුතු අතර

රෙජිස්ට්‍රාර්වරයා වෙත තම ඉල්ලීම ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

(ආ) ඉහත ලියාපදිංචිය සඳහා කරනු ලබන ඉල්ලීමක දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් කලට නිශ්චය කරනු ලබන සුදුසුකම් සපුරා ඇති බවට රෙජිස්ට්‍රාර්වරයා විසින් සෑහීමට පත්වන විට, ඒ සඳහා ඒ තැනත්තාට ලියාපදිංචි කිරීමේ සහතිකයක් යම් යම් නියමයන් හා කොන්දේසි වලට යටත් ව නිකුත් කළ හැක්කේ ය.

(ඇ) අදාළ සුදුසුකම් සපුරා නැති බවට රෙජිස්ට්‍රාර්වරයා විසින් සෑහීමට පත්වන්නේ නම් අදාළ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ යුතු ය.

(ඈ) මහජන සාමය හා සදාචාරය, මානව, සත්ත්ව හෝ ශාක ජීවිතය හා ස්වස්ථතාව ආරක්ෂා කිරීම, සහ පරිසරයට සිදුවිය හැකි අගතිය මග හැරීම සඳහා වාණිජමය සූරාකෑම වැළැක්වීම පිණිස අවශ්‍යවන්නේ යැයි නිශ්චය කරනු ලබන අවස්ථාවන්හි දී ලියාපදිංචිය සඳහා වූ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ හැක්කේ ය.

(ඉ) ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය, පරිසරය, සමාජය හා ආර්ථිකය කෙරෙහි බලපෑම් එල්ල කිරීමට හේතු විය හැකි විනාශකාරී හෝ විනාශකාරී විභවයකින් යුක්ත හෝ තාක්ෂණයකින් හෙබි බීජ හා රෝපණ ද්‍රව්‍ය වලට අදාළව ලියාපදිංචිය සඳහා කරනු ලබන ඉල්ලීම ප්‍රතික්ෂේප කළ හැක්කේ ය.

(ඊ) කලින් අවලංගු නොකරන ලද්දේ නම් මිස, අදාළ ලියාපදිංචිය ඇතුලත් සහතිකය දෑ අවුරුදු කාලසීමාවක් සඳහා බලාත්මකව පැවතිය යුතු ය.

(3) මෙම පනත යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයක අධිකාරිය යටතේ එහි නියමයන් හා කොන්දේසි වලට අනුකූල ව සහ ශාක ආරක්ෂණ නීති රීතින් වලට යටත් ව මිස කිසිම තැනැත්තෙකු විසින් රෝපණය සඳහා කිසිදු බීජ හා රෝපණ ද්‍රව්‍යයක් ශ්‍රී ලංකාව තුලට ආනයනය හෝ ඉන් බැහැරට අපනයනය හා බීජ හසුරුවන්නෙකුට අදාළ අනෙකුත් ක්‍රියාකාරකම් නොකළ යුතු වන්නේ ය.

(4) ඉහත (1) උප වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ ලියාපදිංචි කිරීමක්, ලියාපදිංචි කිරීමේ සහතිකයේ සඳහන් කල්ඉකුත්වීමේ දිනයට මසකට පෙර ලියාපදිංචිය අලුත් කරවා ගැනීමේ ගාස්තු සමගින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් අලුත් කරවා ගත යුතු වන්නේ ය. මේ පිළිබඳ පූර්ණ අභිමතය රෙජිස්ට්‍රාර්වරයා සතු ය.

(5) නියමිත දිනට පෙර ලියාපදිංචිය අලුත් කරවා ගැනීමට අපොහොසත් වන අවස්ථාවක දී තාක්ෂණ හා උපදේශක කමිටුව මගින් නියම කරනු ලැබිය හැකි ගාස්තු හා නිර්ණායකයන්ට අනුව අධිභාරයක් සහ ලියාපදිංචිය අලුත්කර ගැනීමේ ගාස්තු අය කර ගැනීමෙන් අනතුරු ව ලියාපදිංචිය අලුත් කරගත හැකි ය.

(6) ඉහත (2) (ආ) වන උප වගන්තිය යටතේ ලියාපදිංචි සහතිකයක් ලබා ගත් යම් තැනැත්තෙකු අදාළ කොන්දේසි හා විධානයන් පිළිපැදීමට අමතර ව,-

(අ) බීජ හා රෝපණ ද්‍රව්‍ය හැසිරවීමට අදාළ ව සියලු කරුණු සම්බන්ධයෙන් ලේඛන හා දත්ත පවත්වා ගෙන යාම සහ

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා, විෂය භාර අධ්‍යක්ෂවරයා, රෙජිස්ට්‍රාර්වරයා, සහකාර රෙජිස්ට්‍රාර්වරයන් සහ බලයලත් නිලධරයන් අවස්ථාවෝචිත පරිදි පරීක්ෂා කිරීම සඳහා ඉල්ලුම් කල විට ඒ සඳහා අදාල ලේඛන හා දත්ත ඉදිරිපත් කිරීම

එම තැනැත්තාගේ වගකීම වන්නේ ය.

12. (1) බීජ හා රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නන්, **ලියාපදිංචිය අවලංගු කිරීම**

(අ) අදාළ ලියාපදිංචිය සිදු කරන ලද්දේ යම් කොන්දේසි හා නියමයන්ට යටත්ව ද ඉන් යම් කොන්දේසියක් හෝ නියමයක් කඩ කර ඇති බවට

(ආ) එම ලියාපදිංචියේ දක්වා ඇති යම් විධාන ක්‍රියාවේ යෙදවීමට අපොහොසත් වී ඇති බවට සහ

(ඇ) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ යම් වරදක් කර ඇති බවට

විධිමත් පරීක්ෂණයකින් පසුව අනාවරණය වුවහොත් රෙජිස්ට්‍රාර්වරයා විසින් මේ පනත යටතේ නිකුත් කරන ලද ලියාපදිංචිය අවලංගු කළ යුතු ය. අවලංගු කිරීමේ දැන්වීම, ලියාපදිංචි සහතිකයේ හිමිකරු වෙත ලිඛිත ව දැන්විය යුතු ය.

(2) (අ) ලියාපදිංචි කිරීමක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමට

(ආ) ලියාපදිංචි කිරීමක් අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ

(ඇ) ලියාපදිංචි කිරීමක් අවලංගු කිරීමට

රෙජිස්ට්‍රාර්වරයා විසින් ගනු ලැබූ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු ඒ තීරණය ඔහු වෙත දැනුම් දීමෙන් දින හතක් ඇතුලත කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඒ තීරණයට විරුද්ධ ව හේතු සඳහන් කරමින් අභියාචනයක් ලිඛිත ව 19 වන වගන්ති ප්‍රකාර ව ඉදිරිපත් කළ හැක. එම අභියාචනය 19 වන වගන්තිය යටතේ පත් කරන ලද අභියාචන මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුත්තේ ය.

## VI වන කොටස

## කාර්ය පටිපාටිය

13 (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා, විෂය භාර අධ්‍යක්ෂවරයා, රෙජිස්ට්‍රාර්වරයා, සහකාර රෙජිස්ට්‍රාර්වරයන් හෝ බලයලත් නිලධරයන් මෙම පනත යටතේ හෝ මෙම පනත යටතේ පනවා ඇති නියෝග යටතේ තමන් වෙත පවරන ලද රාජකාරි ඉටු කිරීමේ දී හා බලතල ක්‍රියාවේ යෙදවීමේ දී, සිය අනන්‍යතාවය පෙන්වා,- **පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා පරිශ්‍රයට ඇතුළුවීම, පරීක්ෂා කිරීම, නියදි ලබා ගැනීම ආදිය**

(අ) යම් බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කරනු ලබන බවට, පවත්වා ගෙන යනු ලබන බවට, ඇසුරුම් කරනු ලබන බවට, ගබඩා කරනු ලබන බවට, විකිණීම සඳහා තබා ඇති හෝ ගබඩා කර ඇති බවට, ඔහු විසින් විශ්වාස කරනු ලබන යම් පරිශ්‍රයකට සියලු සාධාරණ අවස්ථාවන්හි දී සහායකයින් ඇතුව හෝ නොමැතිව ඇතුළුවීම, අදාළ බීජ හා රෝපණ ද්‍රව්‍ය පරීක්ෂා කිරීම, එවායින් නියදි ලබා ගැනීම සහ එම බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, පවත්වා ගෙන යෑම, ඇසුරුම් කිරීම, හෝ ගබඩා කිරීම සඳහා පාවිච්චි කර ඇති හෝ කරනු ලබන යම් ද්‍රව්‍ය පරීක්ෂා කිරීම;

(ආ) සෝදිසි කිරීමේ අරමුණ ඇතිව, යම් බීජ හා රෝපණ ද්‍රව්‍ය ප්‍රවාහනය

කරනු ලබනු බවට ඔහු විසින් විශ්වාස කරනු ලබන යම් වාහනයක් නැවැත්වීම හෝ රඳවා තබා ගැනීම, අදාළ වාහනය පරීක්ෂා කිරීම, එහි ඇති යම් බීජ හා රෝපණ ද්‍රව්‍යයකින් නියදි ලබා ගැනීම;

(ඈ) යම් බීජ හා රෝපණ ද්‍රව්‍යයක් ඇති බවට ඔහු විසින් විශ්වාස කරනු ලබන යම් භාජනයක් හෝ ඇසුරුමක් හෝ ගබඩාවක් විවෘත කිරීම සහ පරීක්ෂා කිරීම;

(ඇ) අදාළ පරිශ්‍රයේ තිබෙන බීජ හා රෝපණ ද්‍රව්‍යවලට අදාළ තොරතුරු ඇතුලත් වන යම් පොත්පත්, ලිපි ලේඛන, නැව්ගත කිරීමේ බිල්පත්, නෞභාර පත්‍ර හෝ වෙනත් වාර්තා හා ලියකියවිලි පරීක්ෂා කිරීම හා එම පොත්පත්, ලිපි ලේඛන, නැව්ගත කිරීමේ බිල්පත්, නෞභාර පත්‍ර හෝ වෙනත් වාර්තා හා ලියකියවිලි වලින් පිටපත් හෝ සාරාංශ ලබා ගැනීම;

(ඉ) මෙම පනත හෝ එය යටතේ පනවා ඇති නියෝග උල්ලංඝනය කර ඇති බවට ඔහු විසින් විශ්වාස කරනු ලබන යම් බීජ හා රෝපණ ද්‍රව්‍ය පරිග්‍රහණය කර අවශ්‍ය වන්නා වූ කාලයක් තුළ රඳවා තබා ගැනීම;

(ඊ) යම් බීජ හා රෝපණ ද්‍රව්‍ය පිලිබඳ ලේබල් හෝ යම් බීජ හා රෝපණ ද්‍රව්‍ය ප්‍රචාරය කිරීම සඳහා පාවිච්චි කරනු ලබන යම් දැන්වීමක් හෝ දැන්වීම්, පත්‍රිකාවක් හෝ පත්‍රිකා ලේබලයක් හෝ ලේබල පරීක්ෂා කිරීම හා එම ලේබල්, දැන්වීම් හෝ පත්‍රිකා වල පිටපත් ලබා ගැනීම;

(උ) අදාළ පරිශ්‍රයේ තිබෙන බීජ හා රෝපණ ද්‍රව්‍යවලට අදාළ තොරතුරු ඇතුලත් වන යම් පොත්පත්, ලිපි ලේඛන, වෙනත් වාර්තා හෝ ද්‍රව්‍ය යම් තැනැත්තෙකු විසින් මෙම පනත හෝ එහි නියෝග මෙම පනත යටතේ වරදක් කළ බවට සාක්ෂි ලෙස ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන්නේ නම් එවැනි පොත්පත්, ලිපි ලේඛන, වෙනත් වාර්තා හෝ ද්‍රව්‍ය අල්වා රඳවා තබා ගැනීම ;

(ඌ) පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන්නේ නම්, යම් බීජ හා රෝපණ ද්‍රව්‍ය බහා ඇති භාජනයක් අයිතිකරුගේ හෝ භාරකරුගේ අභිමුඛයේ දී, විවෘත කිරීම හෝ යම් බීජ හා රෝපණ ද්‍රව්‍යයක් ගබඩා කර ඇති පරිශ්‍රයක හෝ ගබඩාවක දොරගුළු විවෘත කිරීම අයිතිකරු හෝ භාරකරු ප්‍රතික්ෂේප කරන්නේ නම් එම දොරගුළු විවෘත කිරීම ; සහ

(එ) මෙම පනතින් හා ඒ යටතේ නිකුත් කළ නියෝග වලින් අරමුණු කරන ලද අභිප්‍රායයන් ඉටු කිරීම සඳහා කළ යුතු වූ වෙනත් යම් ක්‍රියාවක් කිරීම

නීත්‍යානුකූල වන්නේ ය.

(2) ඉහත (1) වන උපවගන්තිය ප්‍රකාර ව සිය රාජකාරි ඉටු කරනු ලබන හා බලතල ක්‍රියාවේ යොදවනු ලබන අධ්‍යක්ෂ ජනරාල්වරයාට, විෂය භාර අධ්‍යක්ෂවරයාට, රෙජිස්ට්‍රාර්වරයාට, සහකාර රෙජිස්ට්‍රාර්වරයන්ට හෝ බලයලත් නිලධරයන්ට ඔවුන්ට අවශ්‍ය වූ හා ඉල්ලා සිටිනු ලබන සියලු සාධාරණ පහසුකම් හා සහයෝගය, අදාළ තොරතුරු, සහ අවශ්‍ය නියදි ලබා දීම හෝ ලබා දීමට කටයුතු කිරීම අදාළ පරිශ්‍රය අයිතිකරුගේ, පදිංචිකරුගේ හෝ භාරකරුගේ හෝ එම තැනැත්තන්ගේ නියෝජිතයන්ගේ වගකීම වන්නේ ය.

**පැමිණිලි හා විශේෂ අවස්ථාවන්වල පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා පරිශ්‍රයට ඇතුළුවීම, පරීක්ෂා කිරීම,**

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයාට, විෂය භාර අධ්‍යක්ෂවරයාට, රෙජිස්ට්‍රාර්වරයාට, සහකාර රෙජිස්ට්‍රාර්වරයෙකුට හෝ බලයලත් නිලධාරියෙකු හට යම් බීජ හෝ රෝපණ ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් මෙම පනතින් හෝ ඒ යටතේ ඇති නියෝගයන් මගින් දක්වා ඇති තත්ත්වයන් පිළිබඳ යම් සැකයක් පැන නැගෙන අවස්ථාවක හෝ පැමිණිල්ලක් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට පරිශ්‍රයකට සියලුම සාධාරණ අවස්ථාවන්හිදී ඇතුල්වීම සහ ඉහත (1) වන උපවගන්තියේ දක්වා ඇති ආකාරයට ක්‍රියා කිරීම නීත්‍යානුකූල වන අතර, ඔවුන්ට අවශ්‍ය වූ හා ඉල්ලා සිටිනු ලබන සියලු සාධාරණ පහසුකම් හා

සහයෝගය, අදාළ තොරතුරු සහ අවශ්‍ය නියදි ලබා දීම හෝ ලබා දීමට කටයුතු කිරීම අදාළ පරිශ්‍රය අයිතිකරුගේ, පදිංචිකරුගේ හෝ භාරකරුගේ හෝ එම තැනැත්තන්ගේ නියෝජිතයන්ගේ වගකීම වන්නේ ය. **නියැදි ලබා ගැනීම ආදිය**

(4) මෙම පනතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගවල කාර්යයන් සඳහා යම් බීජ හෝ රෝපණ ද්‍රව්‍යයකින් ලබා ගන්නා වූ නියදිය සමාන කොටස් 3 කට බෙදා සුදුසුවන ආකාරයට ඒ එක් එක් කොටස අදාළ පරිශ්‍රය අයිතිකරු, පදිංචිකරු හෝ භාරකරු හෝ එම තැනැත්තන්ගේ නියෝජිතයා ඉදිරියේ දී සලකුණු කර, මුද්‍රා තබා, එක් කොටසක් බීජ හා රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නාට ද, එක් කොටසක් පරීක්ෂණාගාරයට ද, ඉතිරි කොටස රෙජිස්ට්‍රාර්වරයාට ද භාරදිය යුතු වන්නේ ය.

(5) පරීක්ෂණාගාරයට භාර දෙන ලද නියදියේ කොටස අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව විශ්ලේෂණය කර ප්‍රතිඵල නියදිය භාර දුන් නිලධරයාට ලබා දීම, අදාළ පරීක්ෂණාගාරය භාර නිලධාරියාගේ වගකීම වන අතර, රෙජිස්ට්‍රාර්වරයාට භාර දෙන ලද නියදියේ කොටස සුදුසු පරිදි අවශ්‍ය සම්මත තත්ත්ව යටතේ ගබඩා කළ යුතු වන්නේ ය.

(6) යම් බීජ හෝ රෝපණ ද්‍රව්‍යයක් සඳහා කරන ලද පරීක්ෂණයක ප්‍රතිඵලය සම්බන්ධයෙන් ආරවුලක් ඇති වූ විට රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ නියදියෙන් සම්මත තත්ත්ව යටතේ ගබඩා කර තිබෙන කොටස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරණු ලබන තීරක පරීක්ෂණාගාරයේ ප්‍රධානියා වෙත යැවිය යුතු ය.

(7) මේ පනත යටතේ නඩු කටයුත්තක දී, මෙම වගන්තිය යටතේ පරීක්ෂණය සඳහා ලබාගත් යම් නියදියකට අදාළ ව බලයලත් පරීක්ෂකයෙකු විසින් හෝ තීරක පරීක්ෂකවරයෙකු විසින් අත්සන් කරන ලද සහතිකයක් එහි සඳහන් කරුණු පිළිබඳ ව බැලූ බැල්මට පෙනෙන සාක්ෂි ලෙස පිළිගත යුතු වන්නේ ය.

(8) ඉහත (1) සහ (3) වන උප වගන්තිවල සඳහන් පරීක්ෂා කිරීමෙන් සහ පරීක්ෂණ පැවැත්වීමෙන් පසු ව කිසියම් පරිශ්‍රයක ගබඩා කර ඇති හෝ විකිණීම සඳහා ඉදිරිපත් කර ඇති යම් බීජ හා රෝපණ ද්‍රව්‍ය මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක විධි විධාන උල්ලංඝණය කරනු ලබන බවට හෝ තාක්ෂණ හා උපදේශක කමිටුව විසින් නිර්දේශ කරන ලද ප්‍රමිතීන්ට අනුකූල නොවන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා, විෂය භාර අධ්‍යක්ෂවරයා, රෙජිස්ට්‍රාර්වරයා, සහකාර රෙජිස්ට්‍රාර්වරයා හෝ බලයලත් නිලධරයා සෑහීමකට පත්වන්නේ නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විෂය භාර අධ්‍යක්ෂවරයා, රෙජිස්ට්‍රාර්වරයා හෝ බලයලත් නිලධරයා විසින් අවස්ථාවෝචිත පරිදි තම තීරණය සහ එම තීරණයට හේතු ද ලිඛිත ව ඒ බීජ හෝ රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නාට දැන්විය යුතු අතර, ඒ බීජ හෝ රෝපණ ද්‍රව්‍යවලට අදාළ ව ගත යුතු පියවර ක්‍රියාත්මක කරන ලෙස අවස්ථාවෝචිත පරිදි විධාන කළ යුතු වන්නේ ය.

(9) ඉහත (8) වන උප වගන්තියේ සඳහන් කර ඇති ආකාරයට අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්, විෂය භාර අධ්‍යක්ෂවරයාගෙන්, රෙජිස්ට්‍රාර්වරයාගෙන්, යම් සහකාර රෙජිස්ට්‍රාර්වරයෙකුගෙන් හෝ බලයලත් නිලධරයෙකුගෙන් විධානයක් ලද අදාළ බීජ හෝ රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නා අදාළ කාලය ඇතුලත එම විධානයට අනුව කටයුතු කළ යුතු අතර, එම තැනැත්තා ලේකම්වරයා වෙත 19 වන වගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම් මිස පමණක් එකී විධානය අනුව කටයුතු නොකළ සිටිය හැකි ය.

(10) අභියාචනයක් ඉදිරිපත් කර ඇති විටෙක, එකී අභියාචනයේ තීරණය ලැබෙන තුරු, අදාළ අභියාචක හෝ ඔහුගේ නියෝජිතයන් විසින් එම අභියාචනයට අදාළ බීජ හෝ රෝපණ ද්‍රව්‍ය තොගය අලෙවි කිරීම, අලෙවි කිරීමට යෝජනා කිරීම හෝ ඒ සම්බන්ධ කිසිදු බැහැර කිරීමක් නොකළ යුතු අතර, එම අදාළ බීජ හෝ රෝපණ ද්‍රව්‍ය තොගය අභියාචන තීරණය ලැබෙන තුරු මුද්‍රා තැබීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට විෂය භාර අධ්‍යක්ෂවරයාට රෙජිස්ට්‍රාර්වරයාට සහකාර රෙජිස්ට්‍රාර්වරුන්ට හෝ බලයලත් නිලධාරියාට බලය ඇත.

(11) පැමිණිලි හෝ විශේෂ වන අවස්ථාවල දී හැර, බීජ හෝ රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මය පරීක්ෂා කිරීමේ අරමුණින් හෝ බීජ හෝ රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නන්ගේ කාර්යයන් විධිමත් කිරීමේ අරමුණෙන් බීජ හෝ රෝපණ ද්‍රව්‍යවල නියදි ලබා ගැනීම අවශ්‍ය බවට අධ්‍යක්ෂ **පැමිණිලි හා විශේෂ වන අවස්ථාවන්වල දී හැර පරීක්ෂා**

ජනරාල්වරයා, විෂය භාර අධ්‍යක්ෂවරයා, රෙජිස්ට්‍රාර්වරයා, සහකාර රෙජිස්ට්‍රාර්වරයා, හෝ බලයලත් නිලධරයා විසින් තීරණය කළ විට, සියලු ම සාධාරණ අවස්ථාවල දී බීජ හෝ රෝපණ ද්‍රව්‍ය තබා ඇති යම් පරිශ්‍රයකට ඇතුල්වී අවස්ථාවෝචිත පරිදි සම්මත ක්‍රම වේදයන් අනුගමනය කර එකී බීජ හෝ රෝපණ ද්‍රව්‍යවලින් නියදි ලබා ගත හැකි වන්නේ ය.

**කිරීමේ කාර්යය සඳහා පරිශ්‍රයට ඇතුළුවීම, පරීක්ෂා කිරීම, නියැදි ලබා ගැනීම**

(12) ඉහත (11) උප වගන්තියේ සඳහන් නියදි සම්බන්ධයෙන් කරන ලද බීජ පරීක්ෂණ හෝ විශ්ලේෂණ වාර්තා අනුව අදාළ බීජ හෝ රෝපණ ද්‍රව්‍ය පනතේ ප්‍රමිතීන්ට අනුකූල නොවන බවට වාර්තා වන අවස්ථාවක, අදාළ බීජ හෝ රෝපණ ද්‍රව්‍ය විකිණීම තහනම් කිරීම හෝ විනාශ කිරීම හෝ පනත යටතේ ගනු ලබන වෙනත් සුදුසු ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස නියෝග කළ හැකි වන්නේ ය.

(13) විකිණීම සඳහා ඉදිරිපත් කර ඇති යම් බීජ හා රෝපණ ද්‍රව්‍ය වල ගුණාත්මය තාක්ෂණ හා උපදේශක කමිටුව විසින් නිර්දේශ කරන ලද අවම ප්‍රමිතීන්ට අනුකූල ව තිබේ ද යන්න අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලබන කාල පරාසයන් තුළ දී පරීක්ෂා කර ගැනීම බීජ හා රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නන්ගේ වගකීම වන්නේ ය.

(14) ඉහත (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ලබා ගත් තොරතුරු මෙම පනත පරිපාලනය කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වු අවස්ථාවක දී රජයේ දෙපාර්තමේන්තුවකට හෝ අධිකරණයකට හැර වෙනත් යම් පාර්ශ්වයකට හෙළි නොකළ යුතු වන්නේ ය.

(15) ඉහත (4) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, විෂය භාර අධ්‍යක්ෂවරයා, රෙජිස්ට්‍රාර්වරයා, සහකාර රෙජිස්ට්‍රාර්වරයා, හෝ බලයලත් නිලධරයා විසින් මුද්‍රා තබන ලද යම් බීජ හා රෝපණ ද්‍රව්‍යයක් ඉවත් කිරීම, වෙනස් කිරීම, අපවේශනය කිරීම හෝ වෙනත් ආකාරයකින් මැදිහත් විම අදාළ නිලධරයාගේ අවසරය නොමැතිව කිසිදු තැනැත්තෙකු විසින් නොකළ යුතු වන්නේ ය.

**14.** අධ්‍යක්ෂ ජනරාල්වරයා, විෂය භාර අධ්‍යක්ෂවරයා, රෙජිස්ට්‍රාර්වරයා හෝ බලයලත් නිලධරයා හෝ ඔවුනට සහාය වන යම් තැනැත්තෙකු, යම් පරිශ්‍රයකට ඇතුළුවීමේ හේතුවෙන් හෝ මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ කරන ලද ද්‍රව්‍ය ඉවත් කිරීමක්, බැහැර කිරීමක්, අපනයනය කිරීමක්, විනාශ කිරීමක් හෝ වෙනත් කාර්යයකට යොමු කිරීමක් හෝ යම් ක්‍රියාවක් හෝ කරන ලද යම් දෙයක් හේතුකොට ගෙන, අයුතු ලෙස ඇතුළුවන්නකු ලෙස සලකනු නොලැබිය යුතු අතර මේ පනතේ විධිවිධාන කිසිවක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් ක්‍රියාත්මක කිරිමේ හෝ ක්‍රියාත්මක කිරීම අත්හැරිමේ හේතුමත, එසේ ක්‍රියාත්මක කිරීම හෝ අත්හැරීම කරන ලද්දේ අසද්භාවය හෝ සාධාරණ සහ විය හැකි වූ හේතුවක් නොමැතිව නම් මිස, එසේ ක්‍රියාත්මක කිරීම හෝ අත්හැරීම සම්බන්ධයෙන් යම් අලාභයකට හෝ නඩු පැවරීමකට හෝ යටත් නොවිය යුතු ය.

**අධ්‍යක්ෂ ජනරාල්වරයා, විෂය භාර අධ්‍යක්ෂවරයා, රෙජිස්ට්‍රාර්වරයා සහකාර රෙජිස්ට්‍රාර්වරයා හෝ බලයලත් නිලධරයා හෝ ඔවුන්ට සහාය වන තැනැත්තකු පරිශ්‍රයට ඇතුළුවීම ආදිය හේතු කොට අයුතු ලෙස ඇතුළු වන්නකු ලෙස නොසැලකිය යුතු බව**

**15.** (1) බීජ හා රෝපණ ද්‍රව්‍ය ආනයනය කිරීමට අවසර ලබාදීමට පෙර අදාළ රටේ බීජ හා රෝපණ ද්‍රව්‍ය ප්‍රමිතිය තහවුරු කිරීමේ ක්‍රියා පිළිවෙත පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමකට පත්වන්නේ නම් මිස ඒ සඳහා අවසර ලබා නොදිය යුතු ය.

**ආනයනය, අපනයනය, තහනම් කිරීම හා ප්‍රති අපනයනය කිරීම**

(2) බීජ හා රෝපණ ද්‍රව්‍ය නව ප්‍රභේද වාණිජ කටයුතු සඳහා ආනයනය කිරීමට පෙර එම බීජ හා රෝපණ ද්‍රව්‍ය ප්‍රභේදය මගින් සිදුවිය හැකි කෘෂිකාර්මික, පාරිසරික, සමාජ ආර්ථික බලපෑම හා අනෙකුත් යෝග්‍යතාවයන් පිරික්සීමක් සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අදාළ අංශ වෙත උපදෙස් දිය යුතු අතර අදාළ ඇගයීමෙන් යෝග්‍ය බව තහවුරු වුවහොත් මිස වාණිජ

පදනමින් ආනයනය සඳහා අවසර නොදිය යුතු ය.

(3) ශ්‍රී ලංකාවෙන් පිටතට යම් බීජ හා රෝපණ ද්‍රව්‍යයක් අපනයනය කිරීමට පෙර රටේ කෘෂිකාර්මික අවශ්‍යතාවය හා ආහාර සුරක්ෂිතාවය සැලකිල්ලට ගෙන ඒ සඳහා වලංගු අවසර යක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙතින් ලබාගෙන ඇත්තේ නම් මිස කිසිදු තැනැත්තෙකු එසේ නොකළ යුත්තේ ය.

(4) මේ පනත යටතේ කරනු ලබන යම් පරීක්ෂණයක්, විශ්ලේෂණයක්, විභාගයක්, කරුණු සොයා බැලීමක් හෝ නඩු කටයුත්තක් අවසන් වන තුරු පනතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගවල අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ බලය අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු ය.

(5) යම් පරීක්ෂණ හෝ විශ්ලේෂණ වාර්තාවක් පදනම් කරගෙන යම් බීජ හෝ රෝපණ ද්‍රව්‍යයක් ශ්‍රී ලංකාවේ යම් පරිශ්‍රයකට ආනයනය කිරීම හෝ ප්‍රවිශ්ට කිරීම, බෙදාහැරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හෝ විකිණීම තහනම් කිරීමේ බලය අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වන්නේ ය.

(6) ඉහත (5) වන උපවගන්තියේ විධාන ප්‍රකාර ව තහනමකට ලක් කරන යම් බීජ හෝ රෝපණ ද්‍රව්‍ය තමා විසින් සුදුසු යයි නිශ්චය කරන ආකාරයකින් විනාශ කිරීම වෙනත් ආකාරයකින් බැහැර කිරීම හෝ ප්‍රති අපනයනය කිරීම සඳහා විධානය කිරීමේ බලය අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වන්නේ ය.

**අධ්‍යක්ෂ ජනරාල්වරයා, විෂය භාර අධ්‍යක්ෂවරයාට, රෙජිස්ට්‍රාර්වරයාට, සහකාර රෙජිස්ට්‍රාර්වරයාට හෝ බලයලත් නිලධාරයාට පියවර ගැනීම හෝ වැඩ කිරීමට සහ ඊට වැයවූ වියදම් අයකර ගැනීමට ඇති බලය.**

16. (1) ඉහත 13 වන වගන්තියේ (8) වන උපවගන්තිය යටතේ යම් පරිශ්‍රයක ඇති බීජ හෝ රෝපණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් යම් පියවරක් ගැනීමට හෝ වැඩ ක්‍රියාත්මක කිරීමට එම බීජ හෝ රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නාට හෝ යම් පරිශ්‍රයක අයිතිකරුවෙකුට හෝ පදිංචිකරුවෙකුට නියම කර හෝ විධාන කර ඇති අවස්ථාවක ඒ නියමය හෝ විධානය අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තා පැහැර හරින්නේ නම්, නොසලකා හරින්නේනම් හෝ ප්‍රතික්ෂේප කරන්නේ නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයාට, විෂය භාර අධ්‍යක්ෂවරයාට, රෙජිස්ට්‍රාර්වරයාට, සහකාර රෙජිස්ට්‍රාර්වරයාට හෝ බලයලත් නිලධරයාට සහායකයන් ඇතිව හෝ නැතිව ඒ පියවරගැනීමේ හෝ වැඩ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ඒ පරිශ්‍රයට ඇතුළු විය හැකි ය.

(2) ඉහත (1) වන උපවගන්තිය යටතේ යම් පරිශ්‍රයකට ඇතුළුවන අධ්‍යක්ෂ ජනරාල්වරයා, විෂය භාර අධ්‍යක්ෂවරයා, රෙජිස්ට්‍රාර්වරයා හෝ බලයලත් නිලධරයෙක් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම පහසු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සහායකයන්, උපකරණ හෝ යන්ත්‍රෝපකරණ සහ වාහන ඔහු විසින් පරිශ්‍රය තුළට රැගෙන යා හැකි ය.

(3) ඉහත (1) වන උපවගන්තිය යටතේ යම් පරිශ්‍රයක හෝ පරිශ්‍රයක් මත යම් පියවර ගැනීමේ හෝ යම් වැඩක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා, විෂය භාර අධ්‍යක්ෂවරයා, රෙජිස්ට්‍රාර්වරයා හෝ යම් බලයලත් නිලධරයකු විසින් දරන ලද සියලු සාධාරණ වියදම් සහ රජය විසින් දරන ලද සියලු වියදම් එම පියවර ගැනීමට හෝ එම වැඩය ක්‍රියාත්මක කිරීමට ඉහත 13 වන වගන්තියේ (8) වන උපවගන්තිය යටතේ නියමය ලද හෝ විධානය ලද තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු අතර එම වියදම් එම තැනැත්තාගෙන් මෙහි මින් මතු දැක්වෙන පරිදි අයකර ගත යුතු ය.

(4) ඉහත (3) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු සියලු සාධාරණ වියදම් සහ රජය විසින් දරන ලද සියලු වියදම් එම තැනැත්තා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ගෙවීම කළ හැකි අතර එසේ නොකරන්නේ නම් අදාළ පුද්ගලයා පදිංචි ප්‍රදේශයේ හෝ යම් පියවරක් ගැනීමට හෝ වැඩක් ක්‍රියාත්මක කිරීමට තිබු ප්‍රදේශය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ තත්කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරන ලද යම් බලයලත් නිලධරයකු විසින් කරනු ලබන

ඉල්ලීමක් මත, එම අධිකරණය විසින් පනවනු ලබන දඩයක ආකාරයට අයකරගනු ලැබිය හැකි අතර, එම වියදමේ ප්‍රමාණය එම අධිකරණය විසින් ස්වකීය අධිකරණ බලය සාමාන්‍ය ලෙස ක්‍රියාත්මක කිරීමේ දී පනවනු ලැබිය හැකි දඩයක ප්‍රමාණයට වඩා වැඩි වුව ද එය නොතකා අයකර ගනු ලැබිය හැකි ය.

(5) යම් තැනැත්තකුගෙන් (4) උපවගන්තිය යටතේ අයවිය යුතු වියදම් අයකර ගැනීමේ හේතුවෙන් මෙම පනත හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලට අනුව කරන ලද නියමයකට හෝ විධානයකට එකඟ ව ක්‍රියා කිරීමට එම තැනැත්තා අපොහොසත් වීමේ, පැහැර හැරීමේ, ප්‍රතික්ෂේප කිරීමේ හේතුව නිසා ඔහු යටත් විය හැකි යම් වරදක් සඳහා වූ යම් නඩු පැවරීමකින් එම තැනැත්තා මුදා හරිනු නොලැබිය යුතු ය.

## VII වන කොටස

## බීජ හා රෝපණ ද්‍රව්‍ය සහතික කිරීමේ සේවාව

**17.** (1) පනතේ කාර්යයන් සඳහා අවස්ථාවෝචිත පරිදි, බීජ හා රෝපණ ද්‍රව්‍ය සහතික කිරීමේ ක්‍රියාවලියට අනිවාර්යයෙන් ලක් කළ යුතු බෝග වර්ග හා ප්‍රභේද කවරේද යන්න අධ්‍යක්ෂ ජනරාල්වරයාට කලින් කලට ප්‍රකාශයට පත් කළ යුතු වන්නේ ය.

**බීජ හා රෝපණ ද්‍රව්‍ය සහතික කිරීමේ සේවාව සඳහා විෂය භාර අධ්‍යක්ෂවරයාගේ අනන්‍ය අයිතිය යෙදවීම**

(2) ශ්‍රී ලංකාව තුළ බීජ හා රෝපණ ද්‍රව්‍ය සහතික කිරීමේ ක්‍රියාවලිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවාව මගින් සිදුකරනු ලබන අතර එම විෂය භාර අධ්‍යක්ෂවරයා බීජ හා රෝපණ ද්‍රව්‍ය සහතික කිරීමේ කටයුතු සඳහා අනන්‍ය අයිතිය යෙදවිය යුතු වන්නේ ය. මේ සඳහා රෙජිස්ට්‍රාර්වරයා, සහකාර රෙජිස්ට්‍රාර්වරුන්, බලයලත් නිලධරයන් හෝ වෙනත් තාක්ෂණික නිපුනතාවයකින් යුත් නිලධරයන්ගේ සහාය ලබා ගත හැකි වන්නේ ය.

**විෂය භාර අධ්‍යක්ෂවරයාගේ කාර්ය භාරය**

(3) මෙම පනත යටතේ පහත කාර්යයන් විෂය භාර අධ්‍යක්ෂවරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය යුතුය.

(අ) බීජ සහතික කිරීමේ සේවාවේ සලකුණ හෝ මුද්‍රාව සහිත ව මුද්‍රා, ස්ටිකර්, මුද්දර සහ ලේබල් නිකුත් කිරීම:

(ආ) දේශීය වශයෙන් නිෂ්පාදිත යම් භෝග ප්‍රභේදයකට අයත් හෝ දෙමුහුම් බීජ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරන ලද හා ක්‍රියාත්මක කරනු ලබන සහතික කළ බීජ නිෂ්පාදනය සඳහා වූ රීති, ප්‍රමිතීන් හා මාර්ගෝපදේශ වලට අනුකූල ව නිෂ්පාදනය කරනු ලැබ නොමැත්තේ නම් එකී ප්‍රභේදයක හෝ දෙමුහුමක බීජ හෝ එම භෝග ප්‍රභේදයේ හෝ දෙමුහුමකට අයත් **"සහතික කළ බීජ"** ලෙස ගෙන හැර දැක්වීම හා එසේ සඳහන් කොට විකිණීම තහනම් කිරීම:

(ඇ) ආනයනය කළ බීජ හා රෝපණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් වන විට, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවය විසින් එම බීජ හා රෝපණ ද්‍රව්‍ය වල මුලාරම්භක රටේ බීජ සහතික කිරීමේ නිල ක්‍රියා පිළිවෙත පිළිගෙන ඇත්තේ නම් මිස, යම් භෝග ප්‍රභේදයක් හෝ දෙමුහුමක යම් බීජ හෝ රෝපණ ද්‍රව්‍ය එම භෝගයේ ප්‍රභේදයේ හෝ දෙමුහුමකට අයත් **"සහතික කළ බීජ"** ලෙස ගෙන හැර දැක්වීම හා එසේ සඳහන් කොට විකිණීම තහනම් කිරීම:

(ඇ) නැවත අසුරා දේශීය වෙළඳපලට ඉදිරිපත් කිරීමේ අරමුණින් තොග වශයෙන් බීජ ආනයනය කිරීම සම්බන්ධයෙන් වන විට, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් එම බීජ තොගයෙන් නියදි ලබාගෙන පරීක්ෂා කර ප්‍රමිතියට අනුකූල බවට තහවුරු කර ඇත්තේ නම් මිස අලෙවිය සඳහා ඉදිරිපත් කිරීම හා විකිණීම තහනම් කිරීම:

(ඉ) සහතික කරනු ලබන බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන හා සැකසීමේ කටයුතු වලට අදාළ පරීක්ෂණ කටයුතු මෙහෙය විය යුතු අතර ඒවායේ ප්‍රමිතීන් සහ පිරිවිතර සහතික කිරීමේ ප්‍රමිතියට අනුකූලදැයි පරීක්ෂා කිරීම:

(ඊ) නිෂ්පාදන ක්ෂේත්‍රයේ සිට භාවිතකරන්නන් දක්වා බීජ හා රෝපණ ද්‍රව්‍ය ළඟා වන තුරු අදාළ වන සියලු පරිශ්‍රවලට ඇතුළු වී බීජ හා රෝපණ ද්‍රව්‍ය සහතික කිරීමේ කටයුතු වලට අදාළ පරීක්ෂා කිරීමේ කටයුතු කිරීම:

(උ) බීජ හා රෝපණ ද්‍රව්‍ය සංසරණය සහ අනන්‍යතාව පිළිබඳ ලේඛන පිරික්සීම දේශීය වශයෙන් නිෂ්පාදිත බීජ හා රෝපණ ද්‍රව්‍යවල බීජ වල සහ ආනයනය කරනු ලැබූ බීජ හා රෝපණ ද්‍රව්‍යවල නියදි ගැනීම හා නියමිත ප්‍රමිතීන්වලට අනුකූලවේදැයි පිරික්සීම:

(ඌ) ක්ෂේත්‍ර පරීක්ෂණ, බීජ හා රෝපණ ද්‍රව්‍ය පරීක්ෂණ කටයුතු, බීජ හා රෝපණ ද්‍රව්‍ය සකස් කිරීමේ කටයුතු, බීජ හා රෝපණ ද්‍රව්‍ය නියදි ලබා ගැනීම සහ සහතික කිරීම සඳහා යෝග්‍ය වු බීජ හා රෝපණ ද්‍රව්‍ය තොග සඳහා සහතික කළ ලේබල් යෙදීම යන කාර්යයන් හි දී අනුමත ක්‍රියා පටිපාටියක් භාවිත කිරීම:

(එ) සහතික කරන ලද බීජ හා රෝපණ ද්‍රව්‍ය නියමිත ආකාරයෙන් අසුරා ඇති බවත්, මුද්‍රා තබා ඇති බවත් ඊට ලේබල් යොදා ඇති බවත් සහතික කිරීම:

(ඒ) සහතික කරන ලද බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදකයන්ගේ සහ සැපයුම්කරුවන්ගේ නාම ලේඛනයක් පවත්වාගෙන යාම සහ ප්‍රකාශයට පත් කිරීම:

(ඔ) කෘෂිකර්මාන්තයට වැදගත් වන්නාවූ දේශීය පාරම්පරික බීජ හා ශාක ජාන සම්පත් සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය සහාය ලබාදීම:

(ඕ) රෙජිස්ට්‍රාර්වරයා විසින් යොමු කරන ලද බීජ හා රෝපණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් වන සියලු ම පැමිණිලි සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම:

(4) මෙම වගන්තියේ කාර්යය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ පරීක්ෂා කිරීමේ පරීක්ෂණාගාර හා පශ්චාත් පාලන ක්ෂේත්‍ර නිල පරීක්ෂණාගාර හා පශ්චාත් පාලන ක්ෂේත්‍ර ලෙස සැලකිය යුතු වන්නේ ය.

(5) මෙම පනතේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය වල ගුණාත්මය නිර්ණය කරනු පිණිස පිහිටුවනු ලබන බීජ පරීක්ෂණාගාරවල තත්ත්වයන් හා ප්‍රමිතීන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් කලට ප්‍රකාශයට පත්කළ යුතු ය. එවැනි අදාල නිර්ණායකයන් සපුරා ඇති බීජ පරීක්ෂණාගාරයක් පිළිගත් පරීක්ෂණාගාරයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට ඉල්ලුම් කර ඇති අවස්ථාවකදී ඒ පිළිබඳ විධිමත් ඇගයීමකින් පසු තීරණය කිරීමේ අභිමතය අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු ය.

(6) කෘෂිකර්මයට අදාල නව ප්‍රභේද නිදහස් කිරීමේ දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ

ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුව මගින් නියම කර ඇති නිර්ණායකයන් අනුව හා නව ශාක ප්‍රභේද අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමට අදාළ නීතිරීතින්ට අනුව කටයුතු කළ යුතු අතර නිදහස් කළ නිල ප්‍රභේද ලැයිස්තුවක් අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් පවත්වාගෙන යා යුතු ය.

**බීජ හා රෝපණ ද්‍රව්‍ය සහතික කිරීමේ කටයුතු සඳහා විෂය භාර අධ්‍යක්‍ෂවරයාගේ බලය ලබාදීම**

(7) බීජ හා රෝපණ ද්‍රව්‍ය සහතික කිරීමේ කටයුතු සඳහා අධ්‍යක්‍ෂවරයා වෙත පනතින් පැවරී ඇති කාර්යයන් ඉටු කරවා ගැනීම සඳහා තෝරා ගත් කෘෂිකාර්මික බෝග හා අනෙකුත් වැවිලි බෝගයන් අයත් වන රාජ්‍ය ආයතනයන්හි නිලධාරීන් වෙත බලය අභිනියෝජනය කළ හැක්කේ ය. එහි දී අදාළ නිලධාරීන් තාක්‍ෂණ කමිටුව හා උපදේශක විසින් නිර්දේශ කරන ලද ප්‍රමිතීන් හා මාර්ගෝපදේශයන්ට අනුකූල ව අදාළ සහතික කිරීමේ කටයුතු සිදු කළ යුතු අතර ඊට අදාළ තොරතුරු හා වාර්තා අධ්‍යක්‍ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

## VIII වන කොටස

## කෘෂිකර්මාන්තයට වැදගත් වන්නා වූ දේශීය පාරම්පරික ශාක ජාන සම්පත් ආරක්ෂා කිරීම.

**ජාන සම්පත් හුවමාරුව හෝ ආනයනය හෝ අපනයනය**

18. (1) මෙම පනතේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට වැදගත් වන ජාන සම්පත් පරිබාහිර ව සංරක්ෂණය කොට පවත්වාගෙන යාමේ අනන්‍ය අයිතිය හා වගකීම අධ්‍යක්‍ෂ ජනරාල්වරයා සතු වන අතර ඔහු විසින් එම කාර්යය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය මගින් ක්‍රියාවේ යෙදවිය යුත්තේ ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිඛිත අවසරය ඇත්තේ නම් මිස කිසිදු තැනැත්තෙකු විසින් කෘෂිකර්මාන්තයට වැදගත් වන්නා වූ කිසිදු ශාක ජාන සම්පතක් හුවමාරුව හෝ ආනයනය කිරීම අපනයනය කිරීම හෝ බැහැර කිරීම හෝ පැවරීම ඊට ආනුෂංගික කටයුතු වල නොයෙදිය යුත්තේ ය.

(3) පාරම්පරික කෘෂිකාර්මික බෝග ප්‍රභේද හා ගොවීන් විසින් පවත්වාගෙන යනු ලබන කෘෂිකර්මාන්තයට වැදගත් වන්නා වූ බෝග ප්‍රභේදවල අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය රීතීන් හා මාර්ගෝපදේශ ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුව මගින් සකස් කළ යුතු අතර අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් ඒවා ප්‍රකාශයට පත්කළ යුත්තේ ය.

## IX වන කොටස

## අභියාචන

**අභියාචන**

19. (1) මේ පනතේ කාර්යයන් සඳහා ලේකම්වරයා විසින් අභියාචන මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු ය. පත් කරනු ලබන අභියාචන මණ්ඩලය, බීජ තාක්ෂණඥයෙකු, බීජ ව්‍යාධිවේදියෙකු, කෘමි විද්‍යාවේදියෙකු, ශාක ව්‍යාධිවේදියෙකු, පාංශු විද්‍යාවේදියෙකු, කෘෂි ඉංජිනේරුවරයෙකු, ශෂ්‍ය විද්‍යාඥයෙකු, ජාන තාක්‍ෂණ විද්‍යාඥයෙකු කෘෂි ආර්ථික විද්‍යාඥයෙකු ඇතුලු15 දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයෙන් වසර තුනක කාලයක් සඳහා පත් කර ඒ පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පලකළ යුතු ය. අභියාචනයක් විභාග කිරීම සඳහා ඉහත මණ්ඩලයෙන් පුද්ගලයින් 3 දෙනෙකුගෙන් යුත් කමිටුවකට එම අභියාචනය යොමු කළ යුතු ය.

(2) මෙම පනතේ 12 වන වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ හෝ 13 වන වගන්තියේ (9) වන උපවගන්තිය යටතේ විෂය භාර අධ්‍යක්‍ෂවරයා, රෙජිස්ට්‍රාර්වරයා, සහකාර රෙජිස්ට්‍රාර්වරයා හෝ බලයලත් නිලධාරියෙකුගේ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තෙකු

විසින් එම තීරණය තමා වෙත දැනුම් දී දින 07ක් ඉකුත්වීමට පෙර එම තීරණයට එරෙහිව ලේකම්වරයා වෙත ලිඛිත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර එම අභියාචනයෙහි ඒ සඳහා වූ හේතු සඳහන් කළ යුතු ය.

(3) අභියාචනයක් ලැබීමෙන් අනතුරුව අදාළ අභියාචනය සළකා බැලීමට ප්‍රමාණවත් හේතු පවතින බවට ලේකම්වරයා විසින් සෑහීමකට පත්වන්නේ නම් අදාළ අභියාචනය සම්බන්ධයෙන් ලේකම්වරයා විසින් නිශ්චිත ව දක්වනු ලැබිය හැකි ප්‍රමාණයක මුදල් තැන්පතුවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා නමින් බැංකු අණකරයක් හෝ මුදල් ඇණවුමක් මගින් බැර කිරිමට ලේකම්වරයා විසින් අභියාචකට නියම කළ යුතු වන්නේ ය.

(4) ඉහත (3) උප වගන්තියේ සඳහන් මුදල් තැන්පතුවට අදාළ ලදුපත ලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු තමා අදාළ අභියාචනය භාරගත් බවට අභියාචකට හා අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ එම අභියාචනයට හේතු වූ තීරණය ලබාදුන් විෂය භාර අධ්‍යක්ෂවරයාට හෝ රෙජිස්ට්‍රාර්වරයාට, සහකාර රෙජිස්ට්‍රාර්වරයාට හෝ බලයලත් නිලධාරියාට දැනුම් දී, අභියාචනයට හේතු වූ ක්‍රියාවට අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම අත්හිටුවන ලෙස උපදෙස් දිය යුතු අතර, එම අභියාචනය සලකා බැලීමට සුදුසු කමිටුවක් ලේකම්වරයා විසින් දින 3 ක් ඇතුලත පත් කළ යුතු ය. එම කමිටුව විසින් අදාල අභියාචනය සාධාරණ කාලයක් තුල සලකා බලා තම නිගමන හා නිර්දේශ අවම කාලයක් තුල ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. සාධාරණ කාලයක් යන්න එම අභියාචනයේ ස්වභාවය අනුව ලේකම්වරයා විසින් තීරණය කළ යුතු වන්නේ ය.

(5) අභියාචන මණ්ඩලයේ තීරණය අවසාන හා තීරණාත්මක විය යුතු අතර, ලේකම්වරයා විසින් එම තීරණය වහාම අභියාචකට සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ රෙජිස්ට්‍රාර්වරයාට දැනුම් දිය යුතු ය. අවස්ථාවෝචිත පරිදි අභියාචන මණ්ඩලයේ තීරණය මගින් විෂය භාර අධ්‍යක්ෂවරයා, රෙජිස්ට්‍රාර්වරයා හෝ බලයලත් නිලධාරියාගේ තීරණය ඉවතලන්නේ නම් පමණක් තැන්පත් කරන ලද මුදල ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(6) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයන් අභියාචන මණ්ඩලයේ සාමාජිකයන් වෙත ගෙවනු ලැබිය හැකි ය.

## X වන කොටස

## වැරදි හා දණ්ඩන

**වැරදි සහ දණ්ඩන**

**20.** (1) මේ පනතේ යම් විධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් නිත්‍යානුකූල අධිකාරය හෝ අවසරය නොමැතිව කඩ කරන හෝ මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ ඔහු විසින් නොකළ යුතු හෝ අත්නොහැරිය යුතු යම් දෙයක් ඔහු විසින් කරන හෝ අත්හරින, නැතහොත් අධ්‍යක්ෂ ජනරාල්වරයාට, විෂය භාර අධ්‍යක්ෂවරයාට, රෙජිස්ට්‍රාර්වරයාට, සහකාර රෙජිස්ට්‍රාර්වරයාට හෝ යම් බලයත් නිලධරයෙකුට හෝ ඔවුන්ට සහාය වන යම් තැනැත්තකුට මේ පනතේ යම් විධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් ක්‍රියාත්මක කිරීමේදී, ප්‍රතිරෝධය පාන හෝ අවහිර කරන නැතහොත් ප්‍රතිරෝධය පෑමට හෝ අවහිර කිරීමට සහාය වන හෝ ප්‍රතිරෝධය පෑමට හෝ අවහිර කිරීමට යම් තැනැත්තකු පොළඹවන ඕනෑම තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයාට, විෂය භාර අධ්‍යක්ෂවරයාට, රෙජිස්ට්‍රාර්වරයාට, සහකාර රෙජිස්ට්‍රාර්වරයාට හෝ යම් බලයලත් නිලධරයෙකුට මෙම පනත හෝ ඒ යටතේ නිකුත් කර ඇති නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ තොරතුරු නොදීම, වැරදි තොරතුරු වාචිකව හෝ ලිඛිතව සැපයීම, තොරතුරු වසන් කිරීම, වැරදි ලේඛන හා දත්ත ඉදිරිපත් කිරීම, ජනතාව නොමග යවන සුලු දැන්වීම් ප්‍රසිද්ධ කිරීම, අදාළ නියදි ලබා ගැනීමට විරෝධය පෑම, හෝ ඉඩ ලබා නොදීම, අධ්‍යක්ෂ ජනරාල්වරයාට, විෂය භාර අධ්‍යක්ෂවරයාට, රෙජිස්ට්‍රාර්වරයාට, සහකාර රෙජිස්ට්‍රාර්වරයාට හෝ බලයලත් නිලධාරියකුට බාධා කිරීම, අවහිර කිරීම විරෝධය පෑම, මෙම පනත යටතේ වරදක්

වන්නේ ය.

**(3) සුලු වැරදි සඳහා අධිකරණ ක්‍රියාමාර්ග වලින් තොරව ස්ථානීය දඩ මුදල් අයකර ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීමට යෝජනා කෙරේ.**

(4) මේ පනත යටතේ වරදක් කරන යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට දී ලඝුකාර්ය පටිපාටිය අනුව විභාග කොට වරදකරු කරනු ලැබූ විට මාස එකකට නොඅඩු සහ මාස හයකට නොවැඩි කාලයකට හෝ දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ රුපියල් පනස් දහසකට නොඅඩු දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඩුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය. අනුයාත අවස්ථාවේ දණ්ඩනය දෙගුණයක් ද වසර පහකට ලියාපදිංචිය අත්හිටු විමකට ද යටත් වන අතර තෙවන අවස්ථාවේ දී දණ්ඩනය තුන් ගුණයක් වීම සහ ලියාපදිංචිය අහෝසි කිරීම අසාදු ලේඛන ගතකිරීම හා ඒ බව ජාතික පුවත්පත්වල භාෂා තුනෙන් ම ප්‍රසිද්ධ කිරීමට කටයුතු කළ යුතු ය.

(5) මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක අධිකාරය යටතේ යම් ක්‍රියාවක් ඉටු කිරීමේ මුවාවෙන් අනවශ්‍ය සැහැසි ක්‍රියාවකට වරදකරු වන හෝ අනවශ්‍ය කරදරයක් සිදුකරන සෑම තැනැත්තෙකු ම මෙම පනත යටතේ වරදක් කරන්නේ ය.

(6) (අ) සදෝෂ බීජ හා රෝපණ ද්‍රව්‍ය ආනයනය, නිපදවීම, සකස්කරන, බෙදාහරින, ගබඩාකරන හෝ කිසියම් අයුරකින් වෙළඳපොලට ලැබීමට සළස්වන ඕනෑම පුද්ගලයෙකු ඉන් සිදුවන්නාවූ පාඩුව සඳහා වගකිව යුතුවන අතර ඉන් සිදුවන අලාභය සඳහා හානිපූරණය තාක්‍ෂණ හා උපදේශක කමිටුව මගින් නියම කරනු ලැබිය හැකි නිර්ණායකයන්ට අනුව අදාළ බීජ හා රෝපණ ද්‍රව්‍ය භාවිත කළ තැනැත්තන්ට ලබාදිය යුතු ය.

(ආ) වරද සිදුවී ඇත්තේ ආනයනික බීජ හා රෝපණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් වන විට එමගින් රටේ ආර්ථිකයට හෝ අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් සෑහීමකට පත්වන වෙනයම් අනර්ථයක් සිදුවී ඇතිනම් පරීක්‍ෂණයක්, විමර්ශනයක් හෝ නඩු කටයුත්තක් නිම වනතුරු එකී ආනයනකරුට හෝ කලත්‍රයාට හෝ අනුප්‍රාප්තිකයකුට හෝ නියෝජිතයෙකුට කිසිම ආකාරයකින් එම බෝග වර්ගයේ බීජ හෝ රෝපණ ද්‍රව්‍ය ආනයනයට සහ දේශිය ව අලෙවි කිරීමට සෘජු ව හෝ වක්‍ර ව සහභාගි වීම අත්හිටුවනු ලැබිය යුතු ය. එසේම අදාළ බීජ හෝ රෝපණ ද්‍රව්‍ය තොගය එම පරීක්ෂණය, විමර්ශනය නඩු කටයුත්ත අවසන් වනතුරු අලෙවි කිරීම හෝ අලෙවියට තැබීම නොකළ යුතු ය. එම බීජ හෝ රෝපණ ද්‍රව්‍ය තොග මුද්‍රා තැබිය යුතු ය. තවද සිදුවූ අලාභය පිළිබඳ හානිපූරණය තාක්‍ෂණ හා උපදේශක කමිටුව මගින් නියම කරනු ලැබිය හැකි නිර්ණායකයන්ට අනුව තක්සේරු කර බීජ හා රෝපණ ද්‍රව්‍ය භාවිත කළ තැනැත්තන්ට ලබාදිය යුතු ය.

(7) වරද සිදු වී ඇත්තේ දේශිය බීජ හෝ රෝපණ ද්‍රව්‍ය වර්ගයක / ප්‍රභේදයක නම් එම පරීක්ෂණය/ නඩු කටයුත්ත අවසන් වනතුරු එම බීජ හෝ රෝපණ ද්‍රව්‍ය තොගය අලෙවි කිරීම හෝ අලෙවියට තැබීම නොකළ යුතු ය. එම බීජ හෝ රෝපණ ද්‍රව්‍ය තොග මුද්‍රා තැබිය යුතු ය. තවද සිදු වූ අලාභය තක්සේරු කර හානිපූරණය සඳහා අයකර ගැනිමට කටයුතු කළ යුතු ය.

(8) (අ) පනතේ හා ඒ යටතේ සාදන ලද නියෝගවල ප්‍රතිපාදන හා නියෝගයන්ට පටහැනි ලෙස නීති විරෝධීව මෙරට යම් පරිශ්‍රයකට බීජ හා රෝපණ ද්‍රව්‍ය රැගෙන විත් ඇති බවට තහවුරු කරගත් විටක අදාළ තොගය මුද්‍රා තැබිය යුතු අතර වන්දි ගෙවීමකින් තොරව හා අදාළ තැනැත්තාගේ වියදමින් විනාශ කිරීමට නියෝග කළ යුතු ය.

(ආ) යම් තැනැත්තකු (අ) උපවගන්තිය යටතේ කරන ලද නියමයකට හෝ විධානයකට එකඟ ව ක්‍රියා කිරීමට අපොහොසත්වීමේ, පැහැර හැරීමේ, ප්‍රතික්ෂේප කිරීමේ හේතුව නිසා ඔහු යටත් විය හැකි යම්

වරදක් සඳහා වූ යම් නඩු පැවරීමකින් එම තැනැත්තා මුදා හරිනු නොලැබිය යුතු ය.

(9) මේ පනතට එරෙහිවූ යම් වරදක් සිදු කිරීමේ ලා හෝ ඊට සම්බන්ධ ව භාවිත කරන ලද යම් වාහනයක් හෝ ප්‍රවාහනය කරන්නක් හෝ වෙනත් උපකරණයක්, සැලසුමක්, මෙවලමක් හෝ ද්‍රව්‍යයක් එසේ දඩුවම් ලැබීම කරන කොටගෙන රජය සන්තක කරනු ලැබිය යුතු ය.

(10) යම් පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක,

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක නම් ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකුව, කළමණාකරුවෙකුව, ලේකම් හෝ සමාන වෙනත් නිලධාරියෙකුව සිටි සෑම තැනැත්තෙකුට හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය වෙළෙඳ ආයතනයක් නම් ඒ වෙළෙඳ ආයතනයේ හවුල්කරුවෙකුව සහ කළමණාකරුවෙකුව සිටි සෑම තැනැත්තෙක්ම

(ඇ) ඒ වරද තමාගේ එකඟත්වය හෝ දැනීම නොමැතිව කරන ලද බව හෝ ඒ වරද කිරීම වැළැක්වීමට තමා නිසි ලෙස සියලු උද්යෝගයෙන් කටයුතු කළ බව හෝ ඔහු ඔප්පු කළහොත් මිස ඒ වරද එක් එක්ව හෝ සාමූහික ව කළ ලෙස සලකනු ලැබිය යුතු ය. ඒ සඳහා එක් එක්වත් සාමූහිකවත් වගකිව යුතු ය.

## XI වන කොටස

## නියෝග සෑදීම

**21.** (1) නියෝග සෑදිය යුතු කරුණක් ලෙස මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් අවශ්‍ය වූ හෝ බලයක් දෙනු ලැබ ඇති හෝ යම් කරුණක් සම්බන්ධයෙන් කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය. **නියෝග**

(2) ඉහත (1) වන උපවගන්තියෙන් පවරා ඇති බලතල වලට අගතියක් නොමැති වන සේ කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් නියෝග සෑදිය හැකි ය.

(අ) සියලුම බීජ හා රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නන් ලියාපදිංචි කිරීම, ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම ලියාපදිංචිය අලුත් කිරීම හා ලියාපදිංචිය අවලංගු කිරීම හා ඊට අනුෂංගික කරුණු සම්බන්ධයෙන් විය යුතු අවශ්‍යතාවයන්

(ආ) ලියාපදිංචි කිරීම සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නනට තිබිය යුතු අවම සුදුසුකම්

(ඇ) මෙම පනත යටතේ සිදුකළ යුතු සේවා සහ පහසුකම් සඳහා යම් ගාස්තු අයකිරීම.

(ඈ) බීජ හා රෝපණ ද්‍රව්‍ය හැසිරවීම උදෙසා තිබිය යුතු ප්‍රමිතින් තීරණය කිරීම

(ඉ) බීජ හා රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නන්ගේ ක්‍රියාකාරකම් විධිමත් කිරීම

(ඊ) බීජ හා රෝපණ ද්‍රව්‍ය ආනයනය හා අපනයනයට අදාළ ක්‍රියාපටිපාටිය

(උ) බීජ හා රෝපණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් සාධාරණ මිළක් පවත්වා ගැනිම සඳහා පටිපාටිය.

(ඌ) විධිමත් කරන ලද බීජ හා රෝපණ ද්‍රව්‍ය විශේෂයන් වර්ග, ප්‍රභේද වශයෙන් විශේෂයන් නියම කිරීම සඳහා යාවත්කාලින කිරීම

(එ) ශාක ප්‍රභේදයන් හා ශාක අභිජනකයන්ගේ අයිතින් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වැදගත් වන පරීක්ෂණ හා ඇගයීම් වලට අදාළ විධි විධාන සැලැස්වීම

(ඒ) කෘෂිකර්මාන්තයට වැදගත් වන්නා වූ පාරම්පරික බීජ හා ශාක ජාන සම්පත් සුරැකීම, ශාක ජාන සම්පත් ආනයනය, අපනයනය සහ හුවමාරුවට අදාළ විධිවිධාන හා ගොවීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂාව සම්බන්ධ ක්‍රියාමාර්ගයන්

(ඔ) බලයලත් නිලධාරීන්ගේ කාර්යයන්ට අදාළ බලතල හා කාර්ය පටිපාටිය

(ඕ) බීජ හා රෝපණ ද්‍රව්‍ය සහතික කිරීමට අදාළ ක්‍රියාපටිපාටීන්

(ක) බීජ පරීක්ෂණාගාර, පශ්චාත් පාලන ක්ෂේත්‍ර සඳහා පැවතිය යුතු ප්‍රමිතීන් හා පහසුකම්

(ග) සදෝෂ බීජ හා රෝපණ ද්‍රව්‍ය භාවිත කිරීමෙන් වන හානිය හානිපූරණය කිරීමේ ක්‍රියාපටිපාටිය

(3) ඉහත (1) සහ (2) වන වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයේ සිට හෝ නියෝගයේ සඳහන් වන යම් පසු දිනක සිට හෝ එය ක්‍රියාත්මක වන්නේ ය.

(4) මෙම පනත යටතේ සාදන ලද සෑම නියෝගයක් ම මේ පනතේ අඩංගු වූවා සේ සමානව බලාත්මක විය යුතු ය.

(5) ඉහත (1) සහ (2) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එකී අනනුමත දින සිට ඒ යටතේ එතෙක් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව පරිච්ජින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) යම් නියෝගයක් එසේ යම් දිනයක සිට පරිච්ජින්න කරනු ලැබූ ලෙස ඉහත (5) වන උපවගන්තිය යටතේ සලකනු ලබන විට ඒ දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය

**22.** රීතී සෑදීමට මේ පනතින් බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රීති සාදනු ලැබිය හැකි ය.

**පනත අදාළ කර නොගැනීම**

**23.** යම් තැනැත්තකු විසින් වවනු ලැබූ හා තමාගේ පරිශ්‍රය තුල දී ඔහු විසින් වාණිජමය අරමුණකින් තොරව වෙනත් පුද්ගයකු හට වැපිරීමේ හෝ රෝපණය කිරීමේ කාර්යය සඳහා සම්ප්‍රදායික පිළිවෙත් අනුව හුවමාරු කරන හෝ ගනුදෙනු කරන හෝ එම තැනැත්තාට ඍජු ව භාරදෙනු ලබන යම් වර්ගයකට හෝ ප්‍රභේදයකට අයත් බීජ හෝ රෝපණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන අදාළ නොවන්නේ ය.

24. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. **අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව**

## XII වන කොටස

## අර්ථ නිරූපණය

25. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතේ - **අර්ථ නිරූපණය**

**"සහතික කළ බීජ"** යන්නෙන්, මෙම පනතේ 17 වන වගන්තියේ නිශ්චිත ව සඳහන් ප්‍රමිතීන් හා පටිපාටිය අනුව නිෂ්පාදනය කරනු ලැබූ, සහතික කළ බීජ ලෙස ලේබල් යෙදූ අභිජනන බීජ, අත්තිවාරම් බීජ, ලියාපදිංචි බීජ, සහතික බීජ, පෙරමූලික බීජ, මූලික බීජ, සම්මත බීජ හෝ ආරම්භක බීජ හෝ මෙම බීජ කාණ්ඩ වලට අමතර ව මෙම ප්‍රමිතින්ට අනුකූල වන්නා වූ බීජ පරම්පරාවක් සහතික කළ බීජ යන්නෙන් අදහස් කෙරේ.

**"ආනයනකරු"** යන්නෙන්, යම් බීජ හෝ රෝපණ ද්‍රව්‍ය ශ්‍රී ලංකාවට ගොඩබානු ලැබුවේ හෝ ඇතුල් වූයේ යම් තැනැත්තකුගේ ක්‍රියාවක් මගින් ද ඒ තැනැත්තා අදහස් වේ.

**"අපනයනකරු"** යන්නෙන්, යම් බීජ හෝ රෝපණ ද්‍රව්‍ය ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙන යනු ලැබුවේ හෝ පිටකරනු ලබන්නේ යම් තැනැත්තකුගේ ක්‍රියාවක් මගින් ද ඒ තැනැත්තා අදහස් වේ.

**"පරිශ්‍රය"** යන්නෙන්, බීජ හා රෝපණ ද්‍රව්‍ය තබා ගැනීම, ගබඩා කිරීම, සකස් කිරීම, ප්‍රතිරෝපණය, ගුණනය කිරීම හෝ වැවීම සඳහා හෝ බීජ හා රෝපණ ද්‍රව්‍ය තබා ගැනීම හෝ සැකසීම, ඇසිරීම, ගබඩා කිරීම සඳහා ද සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වශයෙන් භාවිත කරනු ලබන යම් ඉඩමක්, ජලාශ්‍රයක්, ගොඩනැගිල්ලක්, ආයතනයක්, ගබඩාවක්, බහාලුමක්, ප්‍රවාහනය කරන වාහනයක්, අලෙවි කරන ස්ථානයක්, යාත්‍රාවක්, ගුවන් යානාවක් හෝ වෙනත් ගමනාගමන ක්‍රමයක් හෝ මෙ සඳහා භාවිත කළ හැකි වෙනත් ඕනෑම අවකාශයක් මෙයට ඇතුලත් වේ.

**"පලිබෝධ"** යන්නෙන්, යම් ශාකයකට හෝ ශාක නිෂ්පාදනයකට හානි කිරීමට හෝ අලාභ කිරීමට හෝ පාඩු සිදු කිරීමට හැකියාව ඇති යම් ජෛව අණුයෝජකයෙකු අදහස් වන අතර එයට වල් පැළෑටි ද ඇතුලත් වේ.

**"භාවිත කරන්නා"** යන්නෙන්, තමන් විසින් ම හෝ තවත් අයෙකු මගින් යම් වගා මාධ්‍යයක් භාවිත කර බීජ හා රෝපණ ද්‍රව්‍ය වගා කරන පුද්ගලයා වේ. එහෙත් මෙම අර්ථය තුළට බීජ හෝ රෝපණ ද්‍රව්‍ය වාණිජ පදනමින් විකුණන හෝ ප්‍රසම්පාදනයෙහි යෙදී සිටින ස්වාධින සමාගමක් හෝ වෙළෙන්දෙකු හෝ වෙළඳ නියෝජිතයකු බෙදාහරින්නෙකු ඇතුලත් නොවේ.

**"නියමිත"** යන්නෙන්, නියෝග මගින් පිළිගත් බව අදහස් වේ.

**"ලේකම්වරයා"** යන්නෙන්, කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා අදහස් වේ.

**"බීජ හා රෝපණ ද්‍රව්‍ය** යන්නෙන්,

(1) ප්‍රරෝහණය වී පැළයක් බවට පත් වීමට සුදානම් කලලයක් රැගත් ශාකයක

සංසේචනය වී පරිණත වු කොටස.

(2) ආකන්ද, බල්බ, බල්බිල, රයිසෝම, කෝම, ධාවක, මොරෙයියන්, මුල් ඇද්දවීමේ දී ශාකයක් බවට පත් කර ගත හැකි අතු කැබැල්ලක්, මුල් කැබැල්ලක්, ශාක පත්‍රයක්, පටක රෝපිත පැලයක්, බද්ධ පැලයක් හා වෙනත් ඕනෑම ශාක කොටසක්

(3) ඉහත 1 , 2 කාණ්ඩ වලට අයත් නොවන වෙනත් ඕනෑම රෝපණ ද්‍රව්‍යයක් අදහස් වේ

**"බීජ හා රෝපණ ද්‍රව්‍ය හසුරුවන්නකු '"** යන්නෙන්, බීජ නිපදවන්නෙකු, ආනයනකරුවෙකු, අපනයනකරුවෙකු, බෙදාහරින්නෙකු, සකස් කරන්නෙකු, නැවත ඇසුරුම්කරන්නෙකු, ගබඩා කරන්නෙකු, නියෝජිතයෙකු හෝ තොග වෙළෙන්දෙකු, සිල්ලර වෙළෙන්දෙකු හෝ ප්‍රවාහනකරුවෙකු, ජංගම අලෙවිකරුවෙකු වශයෙන් ශ්‍රී ලංකාවේ හෝ විදේශිය වෙළෙඳපලට බීජ හා රෝපණ ද්‍රව්‍ය ඉදිරිපත් කිරීමට සැලැස්වීම සම්බන්ධයෙන් වග කිවයුතු තැනැත්තෙකු හෝ ඔහුගේ අයිතිවාසිකම් පවරනු ලබන තැනැත්තෙකු හෝ නීතිය මගින් බලය පවරනු අයෙකු අදහස් වේ.

**"බීජ තොගය හෝ රෝපණ ද්‍රව්‍ය තොගය "** යන්නෙන් . ලේබලයේ දක්වා ඇති සාධක, පිළිගත හැකි පරාසයක් තුළ ඕනෑම කොටසක හෝ බීජ මල්ලක හෝ රෝපණ ද්‍රව්‍ය තොගයක ඒකාකාරී ව ඇති එක් තොග අංකයකින් හඳුන්වනු ලබන නිශ්චිත බීජ හෝ රෝපණ ද්‍රව්‍ය ප්‍රමාණයක් අදහස් වේ.

**"ප්‍රභේදය"** යනු පියවි ඇසින් සම වර්ගීකයන්ගෙන් පැහැදිලිව ම වෙනස වෙන්කර ගත හැකි, යටත් පිරිසෙයින් එකදු ලක්ෂණයක්වත් සහිත වු ද අන්තර් ප්‍රවේණික ශාක ද ඇතුළු ව ප්‍රචාරණයෙන් පසුව ප්‍රමාණවත් අන්දමින් ස්ථායී හා ඒකාකාරී වන්නා වූ ද ශාක වර්ගීකරණයේ පහළම තත්වයේ ඇති ජීව කාණ්ඩයක් තුළ පවත්නා ශාක සමූහයකි.

**"ජාන විකරණය කරන ලද"** යන්නෙන්, කවර හෝ ක්‍රමයක් උපයෝගී කරගෙන සෛලයකින් බාහිර ව උත්පාදනය කරගනු ලැබූ නියුක්ලික් අම්ල අනු, වයිරසයක්, බැක්ටීරියා ප්ලාස්මිඩයක් හෝ වෙනත් යම් වාහක පද්ධතියක් සම්බන්ධවීමෙන්, ස්වභාවික ව සිදු නොවන එහෙත් ප්‍රජනනය කරගෙන යාමේ හැකියාව ලබා දෙන පරිදි ආගන්තුක ජීවියෙකු තුළට ඇතුළු කොට එවැනි ආගන්තුක ජීවියෙකුට ඒකාබද්ධ වීමට සැලැස්වීමෙන්, උරුම විය හැකි ද්‍රව්‍යවල නව සංයෝගයක් සෑදීමට හෝ ව්‍යුත්පාදනය කිරීමට හෝ සම්බන්ධ නැතහොත් එවැනි ප්‍රතිඵලයක් ගෙන දෙන යම් ක්‍රියාකාරිත්වයකින් ව්‍යුත්පාදනය කරන ලද යන්න අදහස් වේ.

" **"පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය"** - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ජාන සම්පත් පරිභාහිර සංරක්ෂණය සඳහා පිහිටුවා ඇති ආයතනය මින් අදහස් වේ.

**"වැළැක්වීමේ පියවර"** - අවස්ථාවෝචිත පරිදි බලයලත් නිලධාරියා විසින් නියම කරනු ලබන ධූමකරණය, විනාශ කිරීම හා අනෙකුත් බීජ ප්‍රතිකාර කටයුතු

**"තීරක පරීක්ෂණාගාරය"** - කිසියම් විද්‍යාත්මක තීරණයකට එළඹීමේදී අවශ්‍ය වන පරීක්ෂණ නිරවද්‍ය ව කළ හැකි බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමකට පත්වන්නාවූ පරීක්ෂණාගාරයක් මින් අදහස් කෙරේ.

**" නව ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුව"** - අභිජනනයෙන් හෝ වෙනත් යම් විද්‍යාත්මක ක්‍රමවේදයක ප්‍රතිඵලයක් ලෙස ලබාගත් බීජ හෝ රෝපණ ද්‍රව්‍යයක් රෝපණය කිරීම සඳහා යෝග්‍ය බවට තහවුරු කිරීම උදෙසා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරනු ලබන විද්‍යාත්මක ශික්ෂණයන්ගෙන් ප්‍රවීණතාවයක් ඇති පුද්ගලයන්ගෙන් සමන්විත කමිටුව මින් අදහස් කෙරේ.

**"ගබඩා තත්ත්ව"** - බීජ හා රෝපණ ද්‍රව්‍ය ගබඩා කිරීමේදී භාවිත කළ යුතු නිර්ණායකයන් සම්බන්ධයෙන් බීජ හා රෝපණ ද්‍රව්‍ය තාක්ෂණ හා උපදේශක කමිටුව විසින් නිර්දේශ කරනු ලබන සම්මතයන්

**"වර්ගය"** - යම්කිසි බෝග විශේෂයකට හෝ උප විශේෂයකට අයත් ඒකීය වශයෙන් හෝ සාමුහිකව පොදු නාමයකින් හඳුන්වනු ලබන බෝගයක් මින් අදහස් කෙරේ.

**"සුලු වැරදි"** -